October 2025 theSocialist.lk ISSN 3093-6217

the Socialist

ශ්‍රී ලංකාවේ හා දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වයේ මාසික ප්‍රකාශනය

දේශපාලනය | ආර්ථිකය | කලාව | න්‍යාය | ඉතිහාසය

## චෙම්මනි සමූහ මිනීවළවල් ශ්‍රී ලංකා රාජ්‍යයේ පන්ති යුද ප්‍රතිපත්ති හෙළිදරව් කරයි

1995 න් පසු යාපනය වාඩිලා ගත් ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ට මෙම සමූහ මිනී වලවල් සම්බන්ධ කිරීම සඳහා කිසිවකුට අඳුරේ අතපත ගෑමට අවශ්‍ය නැත. පි.2

## කටුවන සමූල ඝාතනය: වසර 36ක බිය ගැන්වීම්වලින් සහ අඛණ්ඩ දණ්ඩමුක්තියකින් පසු ඥාතීහු වින්දිතයන් අනුස්මරණය කරති

“මට මගේ ඇස් අදහා ගන්න බැරි උනා. නිවස කඩා විනාශ කර දමා සියල්ල ගිනිබත් වෙමින් පැවතියා. ප්‍රධාන දොරට කිට්ටුව ගේ ඇතුලේ මිනිස් මාංශ පිච්චෙනවා මම දැක්කා. හිස් කබලක් පිච්චෙනවා මම දැක්කා.” පි.5

## අධිරාජ්‍යවාදය තම “අවසාන විසඳුම” ගාසා තීරයේ දියත් කරයි

පලස්තීනුවන් සාගතයේ තැබීම හෙළා දකින නාම මාත්‍ර ප්‍රකාශ නිකුත් කළ ද, අරාබි පාලන තන්ත්‍ර ගාසා තීරයේ සමූල ජන සංහාරයට සහ බලහත්කාරයෙන් අවතැන් කිරීමට හවුල්කාරී වේ. පාලන තන්ත්‍රයන් විසින් ඊට පහසුකම් සලසා ඇත. පි.13



## ආර්ථික බුබුලු "හොඳයි" යැයි ප්‍රකෝටිපති ජෙෆ් බෙසෝස් ප්‍රකාශ කරයි

ඇමරිකා එක්සත් ජනපදය ආර්ථික බුබුලක් මැද සිටින බවට බෙසෝස්ගේ පිළිගැනීම දශක ගණනාවක පූර්වාදර්ශයන් බිඳ දමයි. පි.11

## ඔගස්ට් බෙබෙල් සහ කම්කරු පන්තියේ දේශපාලන පිබිදීම

ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (SPD) මුල් ඉතිහාසය, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (ICFI) කේඩරය සඳහා තීරණාත්මක පාඩම් ගෙන එයි. පි.15



## බහුචිතවාදියා: තාරුණ්‍යයේ සමාජ අර්බුදය අශුභවාදයට සහ විප්‍රරූපණයකට සිඳලීමක්

මාලක දේවප්‍රියගේ බහුචිතවාදියා චිත්‍රපටය පශ්චාත් සිවිල් යුධ නාගරික ශ්‍රී ලංකාවේ අතරමංව සිටින තාරුණ්‍යයේ ප්‍රතිමූර්තියක් ඉදිරිපත් කිරීමට උත්සාහ කරන අභිලාෂකාමී නමුත් අවසන් විග්‍රහයේදී මංමුළාවූ කෘතියකි. පි.20

ISSN 3093-6217

# වෙම්මනි සමූහ මිනීවළවල් ශ්‍රී ලංකා රාජ්‍යයේ පන්ති යුද ප්‍රතිපත්ති හෙළිදරව් කරයි

සංජය ජයසේකර විසිනි.

මෙම ලිපිය 2025 අගෝස්තු 15 දින ඉංග්‍රීසි බසින් theSocialist.lk වෙබ් අඩවියේ පළ කෙරුණකි.

යාපනයේ අලුතින් අනාවරණය කරගත් වෙම්මනිහි අරියාලෙයි "සිත්තුපත්ති" හින්දු සුසාන භූමියේ ඔවුන්ගේ ළදරුවන් සමඟ කාන්තාවන් එතැනම මරා දැමීමේ පැහැදිලි සලකුණු ද, කඩිමුඩියේ භූමදාන කිරීමද සහ ඇඟ සීතල කරවන මානවකෘති ද–1990 ගණන්වල යුනෙස්කෝව විසින් පරිත්‍යාග කරන ලද ඒවා වැනිම වූ පාසල් බෑගයක්, ළදරු සෙල්ලම් බඩුවක් සහ පෝෂණ (කිරි) බෝතලයක්, කුඩා




වෙම්මනි සමූහ මිනීවළ 2025 අගෝස්තු 01 දින. ඡායාරූප අනුග්‍රහය Kumanan Kana ෆේස්බුක් පිටුවෙනි.

සමූහ මිනීවළේ දෙවැනි අදියරේ කැණීම්වල 28 වැනි දිනය අවසන් වන විට ඇටසැකිලි 147ක්–ඒ අතර බිළිඳුන්, කුඩා දරුවන් සහ මාස දොළහකට අඩු ළදරුවන් ගේද වන ඒවා–ගොඩගෙන ඇත. අඩි දෙකක් තරම් වන නොගැඹුරු වළකින් සොයා ගන්නා ලද මෙම ඇටසැකිලි සහ ඉතිරි පහදු–සමහර සිරුරු එකිනෙක මත ගොඩගැසී ද, සමහර සිරුරු පණපිටින් වළලනු ලැබූ බව අඟවමින් අතපය නැවීගිය ආකාරයෙන් ද වන සේ–පිළිවෙලක් නොමැතිව විසිරී තිබුණි. සියලු දෙනාම ඇඳුම් රහිතව වූ අතර, වීදුරු වළලු, සපත්තු මේස්, සෙරෙප්පු, මැෂින් තුවක්කු බඳක් යැයි සැක කරන්නක්, බිඳීම් සහිත හිස් කබල්–දක්නට විය. මෙම සොයාගැනීම්, දැනටමත් පවතින වාර්තා සහ සාක්ෂි සමගින්, මොවුන් ස්වභාවික විපත්වලට හෝ අහඹු ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන් නොව, ක්‍රමානුකූලව, රාජ්‍ය විසින් සංවිධානය කළ සමූහ ඝාතන ව්‍යාපාරයක ගොදුරු බවට සැකයක් ඉතිරි නොකරයි.

යාපනය මහේස්ත්‍රාත් ඒ.ඒ.ආනන්දරාජා ගේ අධීක්ෂණය යටතේ සහ පුරාවිද්‍යා මහාචාර්ය රාජ් සෝමදේවගේ නායකත්වයෙන් සිදුකෙරෙන කැණීම, අගෝස්තු 6 වැනිදා තාවකාලිකව නවතා දමා අගෝස්තු 22 වැනිදා නැවත ආරම්භ කිරීමට නියමිතය. අගෝස්තු 3 සහ 4 යන දිනවල මෙම ලේඛකයා එම ස්ථානයේ දී මහේස්ත්‍රාත්වරයා සමඟ ද, අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ (OMP) විධායක අධ්‍යක්ෂ ජේ. තත්පරන් හා මහාචාර්ය සෝමදේව සමගද සෘජුවම කතා කළේය. එයින් හෙළි කරන මිලේච්ඡත්වයේ සහ මානව ඛේදවාචකයේ පරිමාණය පිළිබඳව පමණක් නොව, අහිංසක සිවිල් වැසියන්ට එරෙහිව සිදු කරන ලද අපරාධ සම්බන්ධයෙන් එය සපයන ප්‍රතික්ෂේප කළ නොහැකි සාක්ෂි සඳහා ද මෙම සොයාගැනීමේ වැදගත්කම සියල්ලෝම තහවුරු කළහ.

**වෙම්මනි, 1998 සිට අද දක්වා: රාජ්‍ය හමුදා සමූහ මිනීවළ වලට සම්බන්ධ කිරීම**

1995 න් පසු යාපනය වාඩිලා ගත් ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ට මෙම සමූහ මිනී වලවල් සම්බන්ධ කිරීම සඳහා කිසිවකුට අඳුරේ අතපත ගෑමට අවශ්‍ය නැත. සමූහ මිනීවළවල් පවතින බවත් රාජ්‍ය හමුදාව විසින් සමූලඝාතන සිදු කළ බවත් අන්ත දක්ෂිණාංශික සිංහල ජාතිවාදීන් විසින් පවා පිළිගෙන ඇති අවිවාදිත සත්‍යයකි. වෙම්මනි ගොඩගැනීම් වලින් තැතිගත් පිවිතුරු හෙළ උරුමයේ නායක සහ හිටපු ඇමැතියෙක් වූ වර්ගවාදී හා යුධකාමී උදය ගම්මන්පිල මාධ්‍යයට පැවසුවේ, "උතුර යුද්ධයෙන් විනාශ වී ඇති නිසා සමූහ මිනීවළවල් කොතැනක හෝ මතුවෙයි. ඒවා හාරා [ඒවා ගැන] අදහස් දැක්වීම තේරුමක් නැති වැඩක් සහ මුදල් නාස්තියක්," යනුවෙනි.

ආසියානු මානව හිමිකම් කොමිසම

(AHRC) 1997 දෙසැම්බරයේ මෙසේ වාර්තා කළේය: "මෑත කාලයේ යාපනය අර්ධද්වීපයෙන් අතුරුදහන් වූ 600 දෙනෙකුගේ පමණ ඉරණම කුමක් ද යන්න නොදනී". 18 හැවිරිදි දෙමළ පාසල් සිසුවියක් වන ක්‍රිෂාන්ති කුමාරස්වාමි දූෂණය කර ඝාතනය කිරීමේ චෝදනාවට වරදකරු වූ ශ්‍රී ලංකා යුද හමුදාවේ කෝප්‍රල් දේවගේ සෝමරත්න රාජපක්ෂ, "අපි කිසිවකු මැරුවේ නැහැ. අපි සිරුරු වළලූවා පමණයි. සිරුරු 300-400 වළ දමා ඇති ස්ථාන පෙන්වීමට අපිට හැකියි," කොළඹ මහාධිකරණයට ප්‍රකාශ කිරීමත් සමඟ 1998 ජූලි මාසයේදී "චෙම්මනි" යන නාමය ලෝකයේ අවධානයට ලක්විය.

1999 ජූනි මස ගොඩ ගැනීම් වලට ආසන්න පෙරාතුවේ යාපනය මහේස්ත්‍රාත් අධිකරණයේදී, ඔහු මෙසේ කීවේය: "අරියාලෙයි ප්‍රදේශයේ මිනිසුන් අත්අඩංගුවට ගෙන, වධ හිංසා පමුණුවා, වළදැමූ ආකාරය මට ඔබට පෙන්විය හැකියි... චෙම්මනි වල සිරුරු වළ දැමූ ස්ථාන 10 ක් මට ඔබට පෙන්විය හැකියි. මා සමඟ වරදකරුවන් වූ අනෙක් හතර දෙනාට තවත් ස්ථාන හයක් පෙන්විය හැකියි."

1995 දී ශ්‍රී ලංකා හමුදාව අර්ධද්වීපය යළි අත්පත් කර ගැනීමෙන් පසු "අතුරුදහන් වූ" සිවිල් වැසියන් සිය ගනනක් අඩංගු යාපනය ප්‍රදේශයේ රහසිගත සමූහ මිනීවළවල් ජාලයක් රාජපක්ෂගේ සාක්ෂියෙන් හෙළිදරව් විය. 1990 දශකයේ අගභාගයේදී, චෙම්මනි හි සීමිත කැණීම් මගින් පුද්ගලයන් 15 දෙනෙකුගේ අස්ථි කොටස් තහවුරු විය; නමුත්, දේශපාලන බාධා කිරීම්, සාක්ෂිකරුවන් බිය ගැන්වීම, ක්‍රියාපටිපාටිමය බාධා, සහ හිතාමතාම සාක්ෂි විකෘති කිරීම්–රට පුරා විසිරී ඇති වෙනත් බොහෝ සමූහ මිනීවළවල් මෙන්–බොහෝ ස්ථාන දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ අත නොගසා පැවතීම සහතික කළේය.

මුල් චෙම්මනි මිනීවළට කෙටි දුරක් පමණින් පිහිටි වත්මන් අරියාලෙයි සමූහ මිනීවළ, රාජපක්ෂගේ ප්‍රකාශවල සත්‍යතාව තහවුරු කරන අතර ශ්‍රී ලංකා හමුදාව මෙම කුරිරුකම්වලට සෘජුවම සම්බන්ධ කරයි. මාධ්‍ය වාර්තා, මිලිටරි මුරපොලවල් වල නතර කිරීමෙන් පසු සහ වටලෑම් වලදී අතුරුදහන් වූ සිය ගණනක් දෙමළ සිවිල් වැසියන් ලේඛනගත කර ඇත. එකල චෙම්මනි මධ්‍යම හමුදා කඳවුර සුසාන භූමියට යාර කිහිපයක් ආසන්නයේ පිහිටා තිබීම, ඇටසැකිලි අහඹු ලෙස ස්ථානගතව පැවතීම, ඇඳුම් පැළඳුම් නොතිබීම, සිරුරු සමඟ හමු වූ මිලිටරි භාණ්ඩය සහ මොට්ට ආයුධයකින් ලද තුවාල පිළිබඳ සාක්ෂි යන සියල්ල හමුදා පැහැරගැනීම්, වධහිංසා පැමිණවීම් සහ සෘජු මරා දැමීම් හා ගැලපේ.

**රාජ්‍ය මර්දනය: උතුරේ සිට දකුණට**

1988-90 ෆැසිස්ට්වාදී ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) එරෙහි ප්‍රතිකැරැල්ලේදී දකුණේ සිද්ධි 16,700කට වඩා සත්‍යාපනය කර ඇති බව 1997 දෙසැම්බරයේ සඳහන් කරමින් AHRC අතුරුදහන්වීම්වල ක්‍රමානුකූල ස්වභාවය ලේඛනගත කළේය. අපරාධකරුවන්ට එරෙහිව නඩු පැවරීම් හුදෙකලා අවස්ථා කීපයක පමණක් ආරම්භ කරන ලද අතර, ඒ සියල්ලේන්ම පාහේ කිසිදු වරදක් සිදුකළ බවට තීන්දු නොකෙරුණි. ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූව, දකුණේ සහ උතුරේ, හමුදාව සහ පොලිසිය, ඝාතක කල්ලි, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත සමග දඬුවම් නොලබා මිනීමැරීමට සහ මළ සිරුරු බැහැර කිරීමටද, සමූහ මිනීවළවල් භාවිතා කිරීමටද නීතිමය බලපත්‍රයක් ලෙස සේවය කළ හදිසි නීති රෙගුලාසි සමග රාජ්‍යයේ සම්පූර්ණ යාන්ත්‍රණය යොදවා, ධනපති පන්ති පාලනයට, දේශපාලන දකුණෙන් සහ සියල්ලටම ඉහළින් අහිංසක ගැමි දුප්පතුන් සහ පීඩිතයන්ගෙන් එල්ල වනවා යැයි ඔවුන් සිතූ තර්ජනය අහෝසි කිරීමට කටයුතු කළහ.

කෙසේ වෙතත්, සිරුරු බැහැර කිරීමේ ක්‍රමවල වෙනස්කම් තිබුණි. දකුණේ, ටයර් සෑය–ප්‍රසිද්ධ ස්ථානවල මළ සිරුරු පුළුස්සා දැමීම–මහජනයා භීතියට පත් කිරීමට සහ විරෝධය දැක්වීමේ ප්‍රතිවිපාක ප්‍රදර්ශනය කිරීමට භාවිතා කරන ලදී. උතුරේ සහ නැගෙනහිර ප්‍රදේශවල හමුදාව බොහෝ විට තම අපරාධ සඟවා ගනිමින්, මර්දනය දිගටම කරගෙන යන අතරේ, සෝදිසියෙන් වැළකී සිටීම සඳහා දුරස්ථ හෝ පාලිත ප්‍රදේශවල මළ සිරුරු වළදැමූහ.

මේවා "බලය ඉක්මවායෑම්" හෝ "අපගමන" නොව හිතාමතා තීන්දු කළ පන්ති ප්‍රතිපත්තියේ ප්‍රතිඵලය විය. නිදහස් වෙළඳපොල ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීමේ පූර්ව කොන්දේසියක් ලෙස දහස් ගණනක් ඉවත් කර දැමීම සඳහා ගත් සෘජු දේශපාලන තීරණ සහ 1965 ඉන්දුනීසියානු සමූහ ඝාතන ශෛලිය භාවිතය මර්දනය සඳහා ආදර්ශයක් ලෙස ගැනීම ඇතුළුව අතුරුදහන්වීම් පිටුපස රටා හතක් AHRC හඳුනාගෙන ඇත.

**අනුප්‍රාප්තික ආණ්ඩු, හවුල් අපරාධ**

දිවයින පුරා අනාවරණය වී ඇති තවත් දුසිම් දෙකකට ආසන්න ප්‍රමාණයක් වන අනෙකුත් ඒවා සමග, චෙම්මනි සමූහ මිනීවළවල්, හමුදාවට පමණක් නොව, රාජ්‍ය ප්‍රචණ්ඩත්වය කෙරෙහි දණ්ඩමුක්තිය ලබා දුන් පාලන තන්ත්‍රයක මුලසුන දැරූ යූඑන්පී, ශ්‍රීලනිප, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සහ දැන් එන්පීපී/ ජේවීපී යන සෑම ආන්ඩුවකටම එරෙහිව අධි චෝදනා ඉදිරිපත් කරයි.

අද "පිරිසිදු" සහ ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයක් ලෙස පෙනී සිටීමට

උත්සාහ කරන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ), අවම වශයෙන් ප්‍රතිගාමී ඉන්දු-ශ්‍රී ලංකා ගිවිසුම අත්සන් කළ 1987 ජූලි මාසයේ සිට උතුරේ සහ දකුණේ මර්දනය නීත්‍යානුකූල කළ ජාතිකවාදී, ස්වෝත්තමවාදී සහ මිලිටරිවාදී ව්‍යාපාරවල ප්‍රධාන භූමිකාවක් ඉටු කළේය. ජනතා විමුක්ති පෙරමුණ එසේ කළේ හිටපු ජනාධිපතිවරු වන චන්ද්‍රිකා කුමාරතුංග සහ මහින්ද රාජපක්ෂ සමඟ සභාග ආණ්ඩුවලට හවුල් වෙමින් සිටියදීය. ජනතා විමුක්ති පෙරමුණේ දෑත් දෙමළ ජනතාවගේ ලේවලින් තෙත් වී ඇත. වෙම්මනි පිලිබඳ එහි වත්මන් නිශ්ශබ්දතාවය කම්කරු පන්තියට හා දුප්පතුන්ට එරෙහිව එය ආරක්ෂා කරන ධනේශ්වර රාජ්‍යයට සහ අධිරාජ්‍යවාදයට එහි ඇති සැබෑ පන්ති පක්ෂපාතීත්වය පිළිබඳ මහත් සේ හඬ නගයි.

**හමුදාකරණය, බිය ගැන්වීම සහ මර්දනය**

දකුණේ, එජාප රජය යටතේ රාජ්‍ය භීෂණයට සහ ජවිපෙ ෆැසිස්ට්වාදීන්ට ගොදුරු වූවන්ට පොලිස් පැමිණිලි පවා ඉදිරිපත් කිරීමට සීමිත ඉඩක් විවෘත වූයේ, අතුරුදහන් වූවන්ගේ පවුල්වලට සත්‍යය සහ යුක්තිය පිළිබඳ ව්‍යාජ ප්‍රතිඥා දී ජනාධිපති කුමාරතුංග බලයට පත් වූ 1994 න් පසුව පමණි. වැඩි කල් නොගොස්, බෙදුම්වාදී දෙමළ ඊළාම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි යුද්ධය යලි ආරම්භ කිරීමේදී පොදුජන එක්සත් පෙරමුණු (PA) ආණ්ඩුව විසින් හමුදාව ඉහලම උත්කර්ෂයට නංවන ලදී. උතුරේ අඛන්ඩ මිලිටරිකරණය සහ මර්දනය, කම්කරු පන්තිය සහ සියලු විරුද්ධවාදීන් භීත කරමින් පැහැරගැනීම් සාමාන්‍ය දෙයක් බවට පත් කල ජනාධිපති රාජපක්ෂ යටතේ පුනර්ජීවනය කරන ලද යුද්ධය තුල, දකුණ මග හැරියේ නැත. මුළු කාලය පුරාම ජවිපෙ ගෙන ගියේ යුද්ධයට සහාය දෙන දුෂ්ට ස්වෝත්තමවාදී ව්‍යාපාරයකි. අද විශ්‍රාමික හමුදා නිලධාරීන් බොහෝ දුරට ජ්වීපී/එන්පීපී ආණ්ඩුව යටතේ සුරක්ෂිත බලකොටුවක් සොයාගෙන ඇත. අතුරුදහන් වූවන්ගේ අගතියට පත් ඥාතීන්ට අධිකරණ ක්‍රියාවලීන් කරා යාම වැළැක්වූ කොන්දේසි මේවා වූ අතර, පොලිසිය සහ හමුදාව නඩු කටයුතු අවහිර කිරීමට සක්‍රියව මැදිහත් විය.

**ජාතිකවාදී උගුල් සහ අධිරාජ්‍යවාදයට කරන ආයාචනවල ආවෘත අන්තය**

උතුරේ හෝ කොළඹ ක්‍රියාත්මක වන දෙමල ජාතිකවාදී සංවිධාන හෝ දෙමල ඩයස්පෝරාව ඉදිරි මාවතක් ඉදිරිපත් නොකරයි. ඔවුන්ගේ සැබෑ අරමුණ දෙමළ කම්කරු පන්තියට සහ දුප්පතුන්ට එරෙහිව තම වරප්‍රසාද ආරක්ෂා කර ගැනීම සඳහා උතුරු හා නැගෙනහිර ප්‍රභූ ස්වයං-පාලනයක් තහවුරු කර ගැනීමයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය, බටහිර ආන්ඩු සහ ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන වෙත ඔවුන් කරන ආයාචනා හුදෙක් කඩතුරාවක් පමණක් වී ඇති අතර, බොහෝ දුරට එක්සත් ජනපද අධිරාජ්‍යවාදය කොළඹට යටත් වන ලෙස බලපෑම් කිරීම සඳහා ඒවා යොදා ගනී. මේවා, යුද සමයේ කොළඹට, හමුදා, බුද්ධි අංශ සහ රාජ්‍යතාන්ත්‍රික පිටුබලය සැපයූ අධිරාජ්‍යවාදී බලයන්මය.

ඒ හා සමානව, සිංහල ජාතිකවාදය, "ඒකීය රාජ්‍යය සුරැකීමේ" සහ "ජාතික ආරක්ෂාව" ආරක්ෂා කිරීමේ ආවරණය යටතේ අතීත සහ වර්තමාන සමූලඝාතන සාධාරණීකරණය කරයි. වාර්ගික ජාතිකවාදයන් දෙකම සේවය කරන්නේ මර්දනයේ සහ දණ්ඩමුක්තියේ චක්‍රය අවසන් කළ හැකි එකම සමාජ බලවේගය වන කම්කරු පන්තිය බෙදීමට ය.

**සමූල ඝාතන පන්ති යුද්ධයක් ලෙස**

1988-90 කාලයේ දකුණේ සිදුකළ සමූලඝාතන මෙන්ම, 1983-2009 දෙමල විරෝධී සිවිල් යුද්ධයේදී උතුරු හා නැගෙනහිර සිදුවූ ඒවා හුදෙක් වාර්ගික සුළුතරයකට එරෙහිව සිදු කරන ලද අපරාධ නොව, මූලික වශයෙන් පන්ති යුද්ධයේ ක්‍රියාවන් ය. වින්දිතයන්-JVP සබඳතා පිලිබඳ චෝදනා එල්ල වූ ග්‍රාමීය සිංහල තරුනයන් හෝ වේවා, එල්ටීටීඊයට ආධාර කළ බවට සැක කෙරෙන දෙමල ගැමියන් වේවා-අතිමහත් ලෙස ඇදී ආවේ කම්කරු පන්තියෙන්, රැකියා විරහිත තරුනයන්ගෙන් සහ පීඩිත ග්‍රාමීය දුප්පතුන්ගෙනි. ඔවුන්ව තුරන් කිරීමේ අරමුණ වූයේ දේශපාලන විරුද්ධත්වය තලා දැමීම සහ දේශීය ධනේශ්වරය සහ ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනය විසින් ඉල්ලා සිටින "විවෘත ආර්ථික" ප්‍රතිපත්ති පිළිගැනීමට මහජනයා භීතියට පත් කිරීමයි.

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (ICFI) අවධාරනයෙන් පැහැදිලි කර ඇති පරිදි, උතුරේ වින්දිතයින්ට යුක්තිය නොමැතිව දකුණේ වින්දිතයින්ට යුක්තිය ඉටු නොවනු ඇති අතර එහි ප්‍රතිලෝමයද සත්‍ය වනු ඇත. වාර්ගික බෙදීම මත 1948 දී පිහිටුවන ලද ධනේශ්වර රාජ්‍යය තමන්ටම එරෙහිව නඩු පවරා ගැනීම සිදු නොකරන්නාක් මෙන්ම එසේ කරනුද නැත.

**ඉදිරි මාවත: කම්කරු පන්තිය සහ පීඩිතයන් සඳහා සමාජවාදී වැඩපිලිවෙලක්**

මර්දනය අවසන් කිරීම සහ අව්‍යාජ යුක්තිය සුරක්ෂිත කිරීම සඳහා ICFI පැහැදිලි ඉදිරිදර්ශනයක් ඉදිරිපත් කරයි: එනම්, දකුනු ආසියාවේ සමාජවාදී සමූහාන්ඩු සංගමයේ කොටසක් ලෙස, ශ්‍රී ලංකා-ඊලාම් එක්සත් සමාජවාදී රාජ්‍යයක් සඳහා අරගලයේ දී, කම්කරු පන්තියේ ස්වාධීන

දේශපාලන බලමුලු ගැන්වීම තුල සිංහල, දෙමල සහ මුස්ලිම් කම්කරුවන් එක්සත් කිරීම යි.

මේ සඳහා, ඊකියා විරහිත තරුනයින් සමග පීඩිත ග්‍රාමීය හා නාගරික දුගීන්, කම්කරු පන්තියේ නායකත්වය පිටුපස එක්සත් කිරීමට සටන් කරන, නොනවතින විප්ලවයේ ට්‍රොට්ස්කිවාදී වැඩපිළිවෙල මත පදනම් වූ විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගීමය අවශ්‍ය යි. මධ්‍යම පංතිය සහ සුළු ධනේශ්වරය ජාතිකවාදී මිත්‍යාවන්ගෙන් මිදී ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඔවුන්ගේ සැබෑ පන්ති සහෝදර සහෝදරියන් සමඟ එක්විය යුතුය.

සත්‍යය නම් යුක්තිය ඉටුවනු ඇත්තේ හේග්, ජිනීවා හෝ වොෂින්ටනයෙන් නොව, යුද්ධය, ආඥාදායකත්වය සහ සමූහ මිනීමැරුම් බිහි කරන ධනේශ්වර ක්‍රමයට එරෙහිව කම්කරු පන්තියේ ජයග්‍රහණයෙන් බවයි. චෙම්මනි හි මිනීවලවල් හුදෙක් අතීත කුරිරුකම්වල නටබුන් පමණක් නොවේ–ඒවා කම්කරු පන්තිය තවත් පරාජයකට ලක් වුවහොත් ශ්‍රී ලංකා රාජ්‍යය යලිත් කුමක් වෙතට යොමු වනු ඇත්ද යන්න පිළිබඳ අනතුරු ඇඟවීමකි. අධිරාජ්‍යවාදී පිටුබලය ලත් සියොන්වාදී ඊශ්‍රායලය විසින් පලස්තීනුවන් සමූලඝාතනය කිරීම තුලින් අපගේ ඇස් ඉදිරිපිට ප්‍රදර්ශනය කරන ලද මෙය දුරස්ථ වියහැකියාව ක් නොව ජීවමාන යථාර්ථයකි.

**යුද්ධයට, කප්පාදුවට හා ආඥාදායකත්වයට එරෙහිව ලෝක සමාජවාදී වැඩපිළිවෙලකට සටන් වදිනු!**

# කටුවන සමූල ඝාතනය: වසර 36ක බිය ගැන්වීම්වලින් සහ අඛණ්ඩ දණ්ඩමුක්තියකින් පසු ඥාතීහු වින්දිතයන් අනුස්මරණය කරති

අපගේ වාර්තාකරු විසිනි.

මෙම ලිපිය ඉංග්‍රීසි බසින් 2025 සැප්තැම්බර් 05 දින thesocialist.lk හි පළ විය.

අගෝස්තු 27 වන දින, හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන දී, 1989 අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකා හමුදාව විසින් සමූලඝාතනය කරන ලද පවුලේ සාමාජිකයින් හත් දෙනාගේ ඥාතීන් විසින් ඔවුන්ව බෝම්බ ප්‍රහාරයට ලක් කරන ලද එම ස්ථානයේම, තම ආදරණීයයන් සැමරීමේ අවස්ථාවක් පවත්වන ලදී. වසර 36ක් අපරාධකරුවන්ට ලැබුනු දණ්ඩමුක්තියකින් සහ වින්දිතයින්ගේ ඥාතීන්ට එරෙහි පීඩනයෙන් පසු රාජ්‍ය භීෂණයට ගොදුරු වූ මෙම වින්දිතයන් අනුස්මරණය කරමින් සැමරුම් උත්සවයක් පැවැත්වූ පළමු අවස්ථාව මෙය විය. theSocialist.lk වාර්තාකරුවෝ මෙම අවස්ථාවට එක් වූහ.

දශක තුනහමාරකට සහ තවත් වසරකට පෙර, ඒ මාරක රාත්‍රියේදී, ශ්‍රී ලංකා හමුදාවේ සිංහ රෙජිමේන්තුවේ 6 වැනි බලඇණිය එම පවුලේ නිවස ආක්‍රමණය කළේය. එම අවස්ථාවේ නිවසේ සිටි එකම පිරිමියා වූයේ සිංහල පාරම්පරික වෛද්‍යවරයෙක් වූ 63 හැවිරිදි ජේ.එච්.ඒ. එඩ්වින් පියා ය. අනෙක් අය වූයේ 53 හැවිරිදි මව වන එච්.ඒ. සිසිලියානා, තරුණ දියණියන් තිදෙනා වූ, ජේ.එච්.ඒ. නිල්මිණී අශෝකා (25), ජේ.එච්.ඒ. මතඟලතා (20), ජේ.එච්.ඒ. සුජිතසීලි (15), ඥාති දියණියක් වූ ඩබ්ලිව්.ඒ.චන්ද්‍රලේකා (24) සහ 6 හැවිරිදි මිනිබිරිය වූ එන්.ඒ.නිරංජලා විල්සන්ය. සියල්ලෝම සිංහල වාර්ගිකයෝ වූහ. හමුදාව ඔවුන් සියල්ලන්ම එම ස්ථානයේදීම මරා දැමුවේය, නැතහොත් (පසුව මරා දැමූනු ලැබූ) සමහර සාක්ෂිකරුවන්ට අනුව, තරුණ ගැහැණු ළමයින් හතරදෙනා හමුදා කඳවුරට ගෙන ගොස් දින තුනක් දූෂණය කර මරා දමන ලදී. නිවසට



කටුවන සමූලඝාතනයේ වින්දිතයන් – දකුණේ සිට: සිසිලියානා, එඩ්වින්, නිල්මිණී, මතගලතා, සුජිතසීලි, චන්ද්‍රලේකා සහ නිරංජලා. 1990 දී ඝාතනය වූ චූලානන්ද, වමේ සිට මුලින්ම.

බෝම්බ ප්‍රහාරයක් එල්ල වූ අතර නිවස සමඟ පවුලම දවා ලනු ලැබූහ.

ඥාතීන් තම ආදරණීයයන්ගේ පින්තූර ප්‍රදර්ශනය කර ඉටිපන්දම් දැල් වූහ. දිවි ගලවා ගත් දියණියන් දෙදෙනෙක්, ඔවුන්ගේ ස්වාමිපුරුෂයන්, මුණුබුරන් සහ ඔවුන්ගේ පවුල් සහ මිතුරන් විනාඩි කිහිපයක නිශ්ශබ්දතාවයක් පැවැත් වූහ. දශක ගණනාවකට පසුවත් ඔවුන්ගේ කඳුළු වියළී නොතිබුණි. එඩ්වින්ගේ මුණුබුරෙකු වන විමුක්ති මෙසේ සභාව ඇමතීය:

"දිගු වසර 36 ක් තිස්සේ, ඔවුන්ගේ මතකය සැමරීම සඳහා අපට මෙම ඓතිහාසික අවස්ථාව උදා කර ගැනීමට නොහැකි විය. අපට මෙහි පැමිණීමට, ඔවුන්ගේ නම් හඬ ගා කීමට සහ විවෘතව ශෝකය පල කිරීමට අපට නොහැකි විය. භීෂණ තත්ත්වය, මර්දනයේ වාතාවරණය සහ සත්‍යය සහ යුක්තිය සොයන මිනිසුන්ට එරෙහිව අඛණ්ඩව පැවති තර්ජනය අප වැනි පවුල් නිහඬ කළේය. නමුත් නිහඬතාවය යනු අමතක කිරීම නොවේ. මේ වසර ගණනාව අපගේ ශෝකය ගැඹුරු කර ඇති අතර අපගේ අධිෂ්ඨානය ශක්තිමත් කර ඇත.

අද අපි ඒ නිහඬතාවය බිඳ දමමු... ඒවා ක්‍රියාත්මක කළ හමුදාව, ඝාතක කණ්ඩායම් සහ පොලිසියේ සිට ඒවා මෙහෙයවූ දේශපාලන අධිකාරියේ අය දක්වා, නීතිය ඉදිරියේ නොවේ නම්, ඉතිහාසය ඉදිරියේ වගවීමට ලක්කල යුතුය.

අපේ ඥාතීන්ගේ රුධිරය කෑගසන්නේ පළිගැනීම සඳහා නොව සත්‍යය හා යුක්තිය සඳහා ය. මෙම ජීවිත වැදගත් බවත්, දුප්පතුන්, ගම්වැසියන්, එම වසරවල මරා දැමූ අහිංසක මිනිසුන්, ගැහැනුන් සහ තරුණයින්ගේ ජීවිත ගෞරවනීය බව පිළිගැනීම සඳහා එය කෑගසයි.

මෙවැනි අපරාධ නැවත කිසිදා සිදු නොවිය යුතු බවට විරෝධය පළ කිරීමේ ගැඹුරු සලකුණක් ලෙස අපි ඔබේ නම් සහ ඔබට එල්ල කරන ලද කෲරත්වයන් පිලිබඳ මතකය ඉදිරියට ගෙන යන්නෙමු.

සත්‍යය, යුක්තිය සහ ගෞරවය වෙනුවෙන් සහ රාජ්‍ය මර්දනයට එරෙහිව සටන් කරන සැමට ඔබේ මතකය ධෛර්යය ලබා දෙනු ඇත."

එඩ්වින් සහ සිසිලියානාගේ එකම පුත්‍රයා වූ ජේ.එච්.ඒ. චූලානන්ද (22)ගේ නම සඳහන් කරමින්, ඔහු "යුක්තිය සහ සමාජ සමානාත්මතාවය අපේක්ෂා කළ නමුත් යුගයේ ප්‍රතිගාමී දේශපාලන බලවේග විසින් නොමඟ යවන ලද තරුණයෙක්" බවත්, 1990 ඔක්තෝම්බර් මාසයේදී බෙලිඅත්ත පොලිසිය විසින් ඝාතනය කරන ලද බවත් හෙතෙම ප්‍රකාශ කළේය. චූලානන්ද, 1988-1990 කාලය තුල, ෆැසිස්ට් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෙකු වූ බව පැවසේ. කරුනු පැහැදිලි කරන්නේ, ඔහුව අල්ලා ගැනීමට හෝ මරා දැමීමට අපොහොසත් වූ කළ, හමුදාව, පළිගැනීමේ හා ත්‍රස්ත ගැන්වීමේ ක්‍රියාවක් ලෙස, ඔහුගේ මුළු පවුලම සමූලඝාතනය කිරීම සැලසුම් කරන ලද බවයි.

**සාක්ෂි**

මරා දැමුනු අයගේ ඥාතීන් සමඟ අපි කතා කළෙමු. එඩ්වින්ගේ වැඩිමහල් දියණිය චාන්දනී (63) වසර ගණනාවක වේදනාව, විඳදරාගැනීම සහ ජීවන අරගලය පිළිබඳ ඇගේ දුක්බර කතාව අප සමඟ මෙසේ පැවසුවාය:

"මගේ තාත්තට මිනිස්සු කිව්වේ වෙද මහත්තයා කියලා. මිනිස්සු ගොඩක් ඔහුට ආදරේ කළා. ඔහු හරිම අහිංසක, කරුණාවන්ත, අවංක මනුස්සයෙක්. ඔහු අවිද්දෙ හෙමින්, මුහුන ප්‍රියමනාප හිනාවකින් පිරී තිබුනා, මෘදුව කතා කළා, සරමයි ජාතික ඇඳුමයි ඇඳලා හිටියේ. ඉස්සර පැවිදි වෙලා ආයුර්වේද පොත් ගණනාවක් පළ කරලා තිබුණා. ඔහුගෙන් ඖෂධ ප්‍රතිකාර ලැබූ බොහෝ දෙනෙක් මා හමුවී මගේ පියානන්ගෙන් සහ මවගෙන් ලැබුණු දයානුකම්පිත සහ, බොහෝ විට නොමිලේ වූ ප්‍රතිකාර ගැන මට පැවසුවා.

අපේ පවුල දුවලා හය දෙනෙක්ගෙන් වූ ලොකු පවුලක්, මගේ සහෝදරයා චූලානන්ද එකම පුතා. අපේ පවුලේ ආර්ථිකය යැපුනේ මගේ පියාගේ ආයුර්වේද වෙදකමෙන් ලැබෙන සොච්චම්, නමුත් ස්ථාවර ඉපැයීම් මතයි. අපිට කුඹුරු ඉඩම් සහ අක්කර ගාණක පොල්, කුරුඳු, හා පැඟිරි ඉඩම් තිබුණා; ඒවා තාත්තා වගා කරලා කළමනාකරණය කළා. මගේ පියා ජයගත් නමුත්, ඒ ඉඩම් පිළිබඳ නඩු හබ නිසා ඔහුට මූල්‍යමය වශයෙන් අලාභ වුනා වගේම ඔහුගේ ව්‍යාපාර කඩා වැටුණා. අපි හැමෝම ජීවත් වුණේ වරිච්චි ගහල මැටි වලින් හදපු ගෙදරක. කොහොම වුණත්, අපි හැමෝටම හොඳට කන්න දෙන්න, අපිට උගන්වන්න, අසරණ අයට උදව් කරන්න මගේ තාත්තාට තවමත් හැකියාව තිබුණා.

1971 වන විට මගේ පියා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) සහ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රබල ආධාරකරුවෙක් වුනා. කෙසේ වෙතත්, 1977 වන විට, ඔහු සමඟි පෙරමුණු ආණ්ඩුව එපා වී, අතෘප්තියට පත් වී එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දුන්නා. එහි නායක ජේ.ආර්.ජයවර්ධන "ධර්මිෂ්ඨ සමාජයක්" පොරොන්දු වුණා.

අපි හැමෝම ගියේ කටුවන මහා විද්‍යාලයට. මගේ මල්ලී හතේ ශ්‍රේණියෙන් පසු අධ්‍යාපන කටයුතු කරගෙන ගියේ නැහැ. ඔහු ඉතා කාරුණික හා සමාජශීලී තරුණයෙක්. ගම්වැසියන්ට බොහෝ උපකාර කළා.

ඔහු තම පවුලේ අයට වඩා තම මිතුරන් සහ අසල්වැසියන් ගැන සැලකිලිමත් වුනා. බොහෝ විට ඔහු නිවසේ සිටි කාලයට වඩා වැඩි කාලයක් නිවසින් බැහැරව සිටියා. ඔහුගේ කැපී පෙනෙන හා බුද්ධිමත් ස්වභාවයත්, සිත් ඇදගන්නා පෙනුමත් නිසා ස්වභාවිකවම තරුණයින් ඔහුව ඔවුන්ගේ නායකයා ලෙස සැලකුවා. ඔහුට රැකියාවක් කිරීමට අවශ්‍ය වූ නමුත් ගම හැර යාමට ඔහුට අවශ්‍ය නොවීය. මම හිතන්නේ ඔහු 1987 අගභාගයේ සිටම ජනතා විමුක්ති පෙරමුණ සමඟ සම්බන්ධකම් ඇතිකරගෙන තිබුණා.

මගේ සහෝදරයා ගමේ මැරයන්ගේ සහ පියාගේ හිටපු විරුද්ධවාදීන්ගේ උදහසට ලක්ව සිටියා. වරක් ඔවුන් හෙල්ලයෙන් ඇන ඔහුගේ ජීවිතය නැති කිරීමට පවා උත්සාහ කළා. ඔහු යන්තම් දිවි ගලවා ගත් නමුත් ඔහුගේ මිතුරා තුවාල ලබා මිය ගියා.

1979 දී මම ගුරුවරයෙක් සමඟ විවාහ වී වෙනම ජීවත් වුණා. මගේ වැඩිමහල් සහෝදරියක් (ඉන්දුමතී) පසුව පොලිස් නිලධාරියෙකු සමඟ විවාහ වී 1989 මුල් භාගයේදී වැලිමඩ පදිංචියට ගියා. අනෙක් සියලුම සහෝදරියන් මගේ දෙමව්පියන් සමග මහගෙදර ජීවත් වුනා. බාලමයාට වැඩිමල් නංගී 'ලොකු' (සුජිතසීලි) සාමාන්‍ය පෙළ (සා/පෙ) විභාගයටත්, 'හිච්චි' (මතඟලතා) උසස් පෙළ (උ/පෙ) විභාගයටත් ඉගෙන ගනිමින් සිටියා. නීලා (නිල්මිණී) උසස් පෙළින් පසුව රැකියාවක් බලාපොරොත්තුවෙන් වෘත්තීය පුහුණු පාඨමාලාවලට සහභාගි වෙමින් සිටියා.

1989 අගෝස්තු මාසේ ඉස්කෝලේ නිවාඩු කාලේ මගේ වැඩිමල් නංගිලා දෙන්නා [නිල්මිණී සහ මතඟලතා] අපිව බලන්න වලස්මුල්ලේ [කටුවන සිට කිලෝමීටර් 17ක්] අපේ ගෙදරට ආවා. අපගේ මහගෙදර පිහිටා තිබුණේ කටුවන ගොවි ජන සේවා මධ්‍යස්ථානය පරිශ්‍රයේ පිහිටි යුධ හමුදා කඳවුරේ සිට කිලෝමීටර් භාගයක් පමණ දුරින්. මගේ සහෝදරියන් හමුදා කඳවුර පසුකර යද්දී සමහර සොල්දාදුවන්, 'හා... රවුමක් දාල එන්න' යි කෑ ගසා තිබුණා. ඒ අගෝස්තු 26 වැනි දා, සෙනසුරාදා දිනයක්.

මගේ නංගිලා අපිත් එක්ක දවල්ට කෑවා. ඒක තමයි අපි එකට ගත්ත අන්තිම කෑම වේල. මගේ දරුවන් තිදෙනාම ඔවුන්ගේ ආච්චිලා සීයලා සහ පුංචිලා සමඟ නැවතී සිටීමට බොහෝ කැමැත්තක් දැක්වූවා. ඉතින්, තුන්දෙනාම පුංචිලා එක්ක යන්න කියලා අඬන්න ගත්තා. අන්තිමට මගේ දුව නිරංජලා එයාලා එක්ක ගියා.

ඉස්කෝලේ නිවාඩුව ඉවර වෙන නිසා අගෝස්තු 29 වෙනිදා උදේ මගේ මහත්තයා [සැමියා] අපේ දුවව ගෙදර එක්කන් එන්න යාළුවෙක් එක්ක කටුවනට ගියා. මගේ මහත්තයා බෝම්බ දැමූ නිවස දුටුවා; මිනිස් මාංශ සහ හිස් කබලක් පිළිස්සෙනු ඔහු දුටුවා. මගේ දරුවා ඇතුළු කිසිවෙක් ජීවතුන් අතර සිටියේ නැහැ.

සිද්ධියෙන් පසු මම වලස්මුල්ල පොලිසියට පැමිණිල්ලක් කිරීමට ගියේ ඒ වන විට කටුවන ප්‍රදේශයේ පොලිසියක් නොතිබූ බැවිනි. පොලිසිය මගේ පැමිණිල්ල සටහන් කර ගැනීම ප්‍රතික්ෂේප කළා. ස්ථානාධිපති (OIC), කේ.එම්. ප්‍රේමතිලක එයාගේ පිස්තෝලය මගේ කටට තියලා, 'උඹ ගෑණි, කට වහගෙන හිටපං. අවි ගත්තෝ අවියෙන් නසිති,' කියලා කෑ ගැහුවා.

හරියටම මගේ 28 වැනි උපන්දිනය දවසේ, 1990 ඔක්තෝබර් 22 වැනිදා, බෙලිඅත්ත පොලිසියෙන් මගේ මල්ලී ඝාතනය කළා කියලා සිල්වා කියල කෙනෙක්ගෙන් මගේ මහත්තයාට තොරතුරක් ලැබුණා. මගේ මල්ලීට වෙඩි තැබූ බෙලිඅත්ත පොලිසියේ ස්ථානාධිපති දසනායක මෙම ඝාතනය පිළිබඳව ඉක්මනින්ම පළාත් සභා මන්ත්‍රී කේ. ධනපාලට දන්වා තියෙනවා. ධනපාල [ඔහු අවුරුදු කිහිපයකට පෙර මිය ගියේය] මගේ සහෝදරයාගෙන් ඔහුගේ ජීවිතයට තර්ජනයක් වේ යැයි බිය විය; නමුත් එය කිසි විටෙකත් එසේ නොවීය. ධනපාල තෘප්තිමත් කරවන්න දේහය ඔහුට පෙන්වූ පසු පොලීසිය මල්ලීගේ සිරුර ටයර් සෑයක් මත පුලුස්සා තිබුණා.

ධනපාලටත් බොහෝ කලකට පෙර මගේ පියා සමඟ ඉඩම් ආරවුලක් තිබුනා. ඔහු මගේ පියාට එරෙහිව පවරා තිබූ නඩුවක් පැරදුණා. ධනපාල සහ අප අතර කුල භේදයක්ද තිබුනා. මගේ පියාත්, ගමේ ඒ මුළු කොටසම පාහේත් ධනපාලගේ කුලයට වඩා උසස් කුලයකට අයත් වූවක්. ගමේ විවිධ කුලවලට අයත් මිනිසුන් ජීවත් වුනේ 'මණ්ඩි' [පොකුරු] හැටියට."

චාන්දනීගේ ස්වාමිපුරුෂයා වන චමල් (69) සිය කම්පන සහගත අත්දැකීම් මෙසේ හෙළි කළේය:

"අගෝස්තු 29 වෙනිදා උදේ මම මගේ යාළුවෙක් එක්ක එයාගේ කාර් එකේ දුවව ගෙදර එක්කන් එන්න කටුවනට ගියා. මගේ යාළුවාට ඕන වුණා ධනපාල මන්ත්‍රීව හම්බවෙලා එයාගේ අයියගෙ පුතාව වලස්මුල්ල යුද හමුදා කඳවුරෙන් නිදහස් කර ගන්න උදව්වක් ඉල්ලන්න. කටුවන යුද හමුදා කඳවුරේ මාර්ග බාධකය ළඟ හමුදාව අපේ කාර් එක නතර කළා. මගේ යාළුවා කිව්වා අපි මන්ත්‍රී තුමා හම්බ වෙන්න යනවා කියලා. ඒනිසා, අපිට යන්න දුන්නා.

අපි නිවස පිහිටි ස්ථානයට ළඟා වූ විට මට නිවස දකින්නට ලැබුනේ නැහැ. මට පෙනුනේ දුම විතරයි. මම ළඟට ගියා. මට මගේ ඇස් අදහා ගන්න බැරි උනා. නිවස කඩා විනාශ කර දමා සියල්ල ගිනිබත් වෙමින් පැවතියා. ප්‍රධාන දොරට කිට්ටුව ගේ ඇතුලේ මිනිස් මාංශ පිච්චෙනවා මම දැක්කා. හිස් කබලක් පිච්චෙනවා මම දැක්කා. මට හිටගෙන

ඉන්න බැරි වුණා. ගමේ එක්කෙනෙක් දෙන්නෙක් ඇවිත් මාව තදින් අල්ලගත්තා. මගේ නැන්දම්මාගේ සහෝදරියක් මා ළඟට ඇවිත් 'කවුරුත් ජීවතුන් අතර නැහැ. හැමෝම පිච්චිලා', කියලා කිව්වා. මම මගේ දුවගේ නම කියමින් කෑගැසුවා. පුංචිඅම්මා මට කිව්වා, 'මහත්තයා දැන් යන්න. හමුදාව ආවොත් මහත්තයත් මරයි'. ඊට පස්සේ මගේ යාළුවා මාව කාර් එක ඇතුලට තල්ලු කරලා ආපහු ගෙදර ගෙනාවා. මම මගේ බිරිඳට හැමදේම කිව්වා. ඇය පොලොවේ හැපෙමින් වැලපුණා.

සති කිහිපයකට පසු, ධනපාලගේ මුරට හිටපු ග්‍රාම ආරක්ෂකයෙකු වූ [රජයේ සිවිල් ආරක්ෂක බළකායේ සාමාජිකයෙක්] ගාමිණී මට කියා සිටියේ ඔහු සහ තවත් මුරකරුවෙකු අපරාධය කරන විට හමුදාව සමඟ සිටි බවත්, හමුදාවෙන් සියලු දෙනාම මරා දැමූ බවත්, ඒනිසා ඔවුන් ගැන නොසොයන ලෙසත් ය. සහෝදරියන් හතර දෙනා කටුවන හමුදා කඳවුරට ගෙන ගොස් එහි දින තුනක් දූෂණය කර වධ දී මරා දැමූ බව ඔහු මට කීවේය. වැඩි කල් යන්නට මත්තෙන් ඒ මුරකරුවන් දෙදෙනාම ඝාතනය වූ බව මට දැන ගන්නට ලැබුණා.

එම කාලය තුළම අපි පොලිස් ස්ථානවල පැමිණිලි කිරීමට උත්සාහ කළා. ඔවුන් තවමත් කිසියම් රැඳවුම් මධ්‍යස්ථානයක ජීවතුන් අතර සිටින බවට විශ්වාස කළ නිසා අපි හමුදා කඳවුරුවල පවා ඔවුන් සොයමින් සිටියා. මමත් මගේ බිරිඳත් වලස්මුල්ල පොලිසියට පැමිණිල්ලක් කරන්න ගියාම අපිව එලව ගත්තා. මගේ ඥාතීන් ගැන තොරතුරු දැන ගන්න සිංහ රෙජිමේන්තුවේ 6 වැනි බළඇණියේ කපිතාන් පී.එල්.යූ. බුද්ධදාස හමුවීමට වලස්මුල්ල හමුදා කඳවුරට යාමට පවා මම එඩිතර වුණා. ඔහු මට කිව්වා, 'ඔවුන් ගැන හොයන්න එපා. ඒ අය ඔක්කොම මැරිලා. ඔවුන් වෙනුවෙන් පිනක් දහමක් කරන්න,' කියලා. මම තංගල්ල සහකාර පොලිස් අධිකාරී කාර්යාලයට (ඒඑස්පී) පැමිණිලි කිරීමට ගිය විට සහකාර පොලිස් අධිකාරී ඒකනායක මට තර්ජනය කරමින්, 'තමුන් ගුරුවරයෙක්; මැරිච්ච මිනිස්සු ගැන සෙවීමට උත්සාහ කරන්න එපා. එසේ නොවුණහොත් තමුන්ට තමුන්ගේ ජීවිතයත් අහිමි වෙයි', කියලා කෑ ගැසුවා.

මට මිද්දෙණිය පොලිසියට පැමිණිල්ලක් කරන්න පුළුවන් වුණේ 1994 සැප්තැම්බර් අගදී චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ජනාධිපති වුණාට පස්සේ. අතුරුදන් වූවන් පිළිබඳ ජනාධිපති කොමිසමට පැමිණිලි කරන්නත් අපට පුළුවන් වුණා. මුත්තෙට්ටුවේගම කොමිසමේ අවසන් වාර්තාවේ අපේ ඥාතීන් හත් දෙනාගේ නම් තිබෙනවා.

කෙසේ වෙතත්, 1998 න් පසු මෙම නඩුව කිසි දිනක ඉදිරියට ගියේ නැහැ. සමූල ඝාතන භූමියේ සාම්පල එකතු කර වසර හතරක් ගතවී තිබියදී, මෙම නඩුව ක්‍රමානුකූලව වළලන්නට පොලිසිය ධනපාල සමඟ හවුල් වී ඇති බව අපට දැනගන්නට ලැබුණා.

මටත්, මගේ බිරිඳටත් විඳදරාගැනීමට සිදු වූ දිගුකාලීන මානසික කම්පනය නිසා මට ගුරුවරයෙක් ලෙස මගේ වැඩ කටයුතු අවංකව කරගෙන යාමට නොහැකි වුනා. ඒ නිසා මම අංක 44/90 චක්‍රලේඛය යටතේ විශ්‍රාම යාමට තීරණය කළා. ඊට පස්සේ අපේ පවුලේ තත්ත්වය නරක අතට හැරුණා. දරුවන් හතර දෙනෙකුගෙන් යුත් මගේ පවුලේ පැවැත්ම සඳහා මට අරගල කිරීමට සිදුවුණා.

චන්ද්‍රිකා එල්ටීටීඊය [දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය] සමඟ යුද්ධය නැවත ආරම්භ කළා. 1998 වන විට ශ්‍රී ලංකා හමුදාව යාපනයේ අහිංසක දෙමළ ජනතාවට කළ අපරාධ ගැන අපට දැනගන්නට ලැබුණා. ක්‍රිෂාන්ති කුමාරස්වාමි සහ ඇගේ පවුලේ අය චෙම්මනිහිදී ඝාතනය කිරීමේ සිද්ධිය අපගේ ආත්මයන් කම්පා කළා. එතකොට අපිට තේරුණා සමහර වෙලාවට අපේ පවුලට කරපු අපරාධවලට වඩා දෙමළ මිනිස්සුන්ට උතුරේ විඳවන්න සිද්ධ වෙන්න ඇති අපරාධවල තරම. පසුව, මහින්ද රාජපක්ෂ යුද්ධය දිගටම කරගෙන ගියා; ඔහුගේ සහ ඔහුගෙන් පසු සියලු රජයක්ම කුලී මිනී මරුවන් 'රණ විරුවන්' ලෙස වර්ණනා කළා. ඒ මුළු කාලය පුරාම අපව නිහඬ කරනු ලැබුවා."

එකල ව්‍යාජ "මානව හිමිකම්" සටන් කරුවන් පිළිඹඳ ඔහුගේ අත්දැකීම් ගැන ද ඔහු අපට පැවසීය:

"මගේ බිරිඳගේ අනාථ වූ බාලම සොහොයුරිය ඒ කාලය තුළ ඉගෙනුම ලබමින් අප සමඟ ජීවත් වූවා. වරක්, 1997 මුල් භාගයේදී, ඇයට රැකියාවක් සොයා දීමට උදව්වක් අපේක්ෂාවෙන් මම ඇය සමඟ මහින්ද රාජපක්ෂ හමුවීමට ඔහුගේ තංගල්ල කාල්ටන් කාර්යාලයට ගියා. මගේ දෙමව්පියන් ඩී.ඒ. රාජපක්ෂ වෙනුවෙන් වැඩ කළා; තරුණයෙකු ලෙස මම මහින්දගේ මැතිවරණ සඳහා මැතිවරණ ව්‍යාපාරයේ නියැලිලා තිබුණා. ඉතින්, මම ඔහුව පෞද්ගලිකව දැන සිටියා. ඔහුව හමුවීමට බොහෝ වේලාවක් බලා සිටීමෙන් පසු, අපි බලහත්කාරයෙන් ඔහුගේ කාමරයට ඇතුළු වී පවුලේ සමූලඝාතනයෙන් පසු අපගේ දුෂ්කර තත්වය ඔහුට දැනුම් දුන්නා. ඔහු අපට කෑ ගැසුවා: 'බලන්න, මේ කට්ටිය ජවිපෙට වැඩ කරලා මරෝගෙන, දැන් රැකියා ගන්න මගේ උදව් ඉල්ලගෙන ඇවිත්'. මගේ නෑනා හඬා වැටුනා. ඇයට ඔහුගෙන් රැකියාවක් හෝ කිසිදු උදව්වක් ලැබුණේ නැහැ."

පවුලේ ඉතිරි වූ තවත් වැඩිමල් දියණියක් වන ඉන්දුමතී ප්‍රාදේශීය දේශපාලකයා පවුල කෙරෙහි බැඳගෙන තිබූ ද්වේශය

පිළිබඳ සිය අත්දැකීම මෙසේ පැවසුවාය:

"මගේ තාත්තා 1988 අග සහ 1989 මුල මැතිවරණවලදී එජාපයට සහය දුන් නිසා, මහ මැතිවරණයෙන් පසු, මගේ පියා මා සමඟ ගියා ධනපාල මන්ත්‍රීට කතා කිරීමට. අපේ දෙමවුපියන්ගේ නිවස තිබුණේ ඔහුගේ නිවසට යාර කිහිපයක් දුරින්. ඔහු මුල්කිරිගල ආසනයේ එවකට එක්සත් ජාතික පක්ෂ කැබිනට් අමාත්‍යවරයා වූ ආනන්ද කුලරත්නගේ බාප්පා විය. පසු කාලීනව අපට දැනගන්නට ලැබුණා මගේ සහෝදරයා ඒ කාලේ ජනතා විමුක්ති පෙරමුණේ (ජවිපෙ) ක්‍රියාකාරකම්වල පූර්ණ කාලීනව නියැලී සිටි බව. මැතිවරණවලදී ඡන්දය නොදෙන ලෙස ජවිපෙ නියෝග කර තිබුණා [දකුණු පළාතේ පළාත් සභා මැතිවරණය 1988 ජුනි මාසයේදී පැවැත්විණි]. ධනපාල හිතුවෙ ජවිපෙ සහ එහි සන්නද්ධ අංශය වූ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය (DJV) මගින් ඔහුගේ ජීවිතයට තර්ජනයක් එල්ල වී ඇති බව යි. කෙසේ වෙතත්, ගම්වැසියන් පවසන්නේ මගේ සහෝදරයා ගමේ කිසිවෙකුට, අපේ පවුලට ඊර්ෂ්‍යා කළ අයට පවා, හානියක් කිරීමට කිසිඳු ඉඩක් නොතැබූ බවයි. මට හෝ අපේ පවුලේ වෙනත් කිසිවෙකුට රැකියා සොයා දීම ධනපාල දැඩි ලෙස ප්‍රතික්ෂේප කළා. 'ඔය ගෙදර ත්‍රස්තවාදියෙක් ඉන්නවා. වෙද මහත්තයා සිටියේ නැත්නම්, මෙලහකටත් ඔය ගෙදර තමුසෙලත් එක්කම අලුවෙලා ඉවරයි,' කියල ඔහු කෑ ගැසුවා.

නමුත්, මගේ දෙමවුපියන් හෝ කිසිවකු ළඟදීම නියමිත සමූල ඝාතනයක් ගැන සිහිනෙන්වත් නොසිතුවේ, එවැනි සිදුවීම් අප මීට පෙර අසා නොතිබූ නිසයි.

අපේ නිවසට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීමට දින දෙකකට පමණ පෙර මගේ වැඩිමහල් සහෝදරිය, නීලා මට ලිපියක් එවා කියා තිබුණේ, පෙරේදා එම ප්‍රදේශයේ හමුදාව ඉලක්ක කර බෝම්බ ප්‍රහාරයක් එල්ල වූ බවත්, එයින් සෙබළුන් කිහිප දෙනෙකු මිය ගිය බවත්ය. මගේ සහෝදරිය ලියල තිබුනා දැන් ඔවුන්ට ඔවුන්ගේ ජීවිතත් අනතුරේ කියලා දැනෙනවා කියලා. මම හිතන්නේ ඒ ලියුම තැපෑලට දාපු දවසෙ තමයි එයායි හිච්චියි අපේ ලොකු අක්කාව බලන්න වලස්මුල්ලේ එයාගේ ගෙදරට ගිහින් තියෙන්නෙ. ඒ ලියුම එවනකොට අපේ හීං නංගී [සුනීතා] මාත් එක්ක මගේ ගෙදර හිටියා. ඒ නිසා ඇගේ ජීවිතය බේරුණා."

දිවි ගලවා ගත් බාලම දියණිය සහ දැන් ගුරුවරියක් වන සුනීතා තම ආදරණීය දෙමාපියන්, තම සහෝදරයා සහ හමුදාවෙන් එල්ල වූ හිරිහැර ගැන කඳුළු සලමින් සිහිපත් කළාය:

"මගේ පියා බෝධිසත්වයෙක්. රටේ විවිධ ප්‍රදේශවල මිනිසුන් විසින් සොයනු ලැබූ දක්ෂ වෛද්‍යවරයෙකු ලෙස, සර්ප දෂ්ට කිරීම්වලින් පසු ගෙන එන ලද බොහෝ රෝගීන්ගේ ජීවිත ඔහු කොතරම් ආශ්චර්යමත් ලෙස බේරා ගත්තාද යන්න මම දුටුවා. විවිධ අනතුරු හේතුවෙන් සිදු වූ අත් පා කැඩීම් බිඳීම් ඔහු දක්ෂ ලෙස සුව කළ ආකාරය ද මම දුටුවා. මගේ මව මගේ පියාට පරිපූර්ණ ගැළපුමක්. දේවතාවියක් මෙන්, ඇය රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා දිවා රෑ කැපවී සිටියා.

අපේ තාත්තා වෙද ග්‍රන්ථ කිහිපයක් ලියා පළ කර තිබුණා. ඒවා ලියා ඇත්තේ කවි පද ස්වරූපයෙන්. සර්ප විෂ සංහාරය I සහ II, හා බිලිඳු රෝග සංහාරය ඉතා ජනප්‍රිය වූ අතර මන්ත්‍ර ශතකය තවමත් පොත් සාප්පු වල අලෙවි වන පොතක්.

ඔහු කිසිවිටෙක කිසිවෙකුට, කෘමියෙකුටවත් හානියක් කළේ නෑ. එවැනි තේජසකින් යුත් මිනිසෙකුට ගිනි අවියක් එල්ල කර ඔහුව මරා දැමීමට යමෙකු කෙතරම් කුරිරු විය යුතු දැයි මට තේරුම් ගත නොහැකියි. මේ ලෝකය ශාප ලත් වේ!

අයියා හරිම කඩවසම් කෙනෙක්. ඔහු සෑම විටම අන් අයට උපකාර කළ අතර සහානුකම්පාවෙන් යුක්තව සිටියා. ඔහු ගමේ තරුණයන්ට නායකයෙක් වුනා. සමහර විට ගමේ තරුණයන් ඔහුව පාවා දුන්නේ ඔහු කළ වරදක් නිසා නොව කුඩා ආරවුල් සහ රණ්ඩු සරුවල්වලට අත්අඩංගුවට ගත් විට තමුන්ට බේරීමට යි.

අපේ පවුල ඝාතනයට මාස දහයකට පමණ පෙර කටුවන යුද හමුදා කඳවුරේ ප්‍රධානියා අනෙක් සොල්දාදුවන් සමඟ අපේ පැරණි නිවසට පැමිණ එදින රාත්‍රී 7.00 ට අපේ නිවස හිනිබත් කිරීමට යන බැවින් අවශ්‍ය සියලුම බඩු බාහිරාදිය ඉවත් කර ගන්නා ලෙස තාත්තාට කියා සිටියා. "අපට හිංසා කරන්න එපා, මගේ පුතා වරදක් කර ඇත්නම් ඔහුට දඬුවම් කරන්න" යි කියා මගේ පියා ඔහුගෙන් ඉල්ලා සිටියා. ඒත් ඔවුන් අපේ ගෙදරට ගිනි තිබ්බා. සමූල ඝාතනය වන විට අපේ පවුල පදිංචිව සිටි රුක්මල්පිටිය පාර අයිනේ තිබූ නිවස එම මාර්ගයේම තිබූ පැරණි නිවසට මීටර් සියයක් පමණ දුරින් පසුව ඉදිකරන ලද්දක්.

මට මතකයි රාජ්‍ය ත්‍රස්තවාදය පැවැති කාලයේ හමුදාව නිතරම අපේ ගෙදරට රිංගලා ඇතුලේ හැමතැනම සෝදිසි කළා. අපි නිතරම භීතියට පත් වුණා. ඒ අය හොඳටම දැනගෙන හිටියා මගේ අයියා ගෙදර නැති බවත්, අපේ වයසක අම්මා තාත්තා සහ අපි ගෑනු ළමයි විතරයි එතන හිටියේ කියලා. ඒ අය අපෙන් අයියා ගැන ප්‍රශ්න කරලා පොත්පත් පවා හෙව්වා. සමහර වෙලාවට අපි නිදාගෙන ඉද්දි රෑ මැදියමේ පවා ඒ අය කඩා වැදුනා. ඉන් පස්සෙ භූමිතෙල් ලාම්පු නිවන්න කියලා, එහේ මෙහේ හොයනවා."

**ක්‍රමානුකූල ඝාතන රැල්ලක්**

දකුණේ සහ උතුරේ, ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූව, ධනේශ්වර පාලනයට දේශපාලන දක්ෂිනාංශයෙන් එල්ල විය හැකි තර්ජනය තුරන් කිරීමට හා, සියල්ලටත් වඩා, අහිංසක ග්‍රාමීය දුප්පතුන්ට හා පීඩිතයන්ට එරෙහිව, මිලිටරිය සහ පොලිසිය, ඝාතක කල්ලි, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත සහ හදිසි අවස්ථා රෙගුලාසි යන රාජ්‍යයේ සම්පූර්ණ යාන්ත්‍රණය දිගේලි කළේය. එම කාලපරිච්ඡේදය තුළ සිදු වූ මහා පරිමාණ අතුරුදන්වීම්වලට හේතු සූත්‍රගත කරමින්, 1997 දෙසැම්බර් මස ආසියානු මානව හිමිකම් කොමිෂන් සභා වාර්තාව (AHRC) මෙසේ ප්‍රකාශ කළේය:

"හදිසි අවස්ථා රෙගුලාසි යටතේ, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට තිබූ සියලු සීමාවන් ඉවත් කරන ලද අතර, මළ සිරුරු බැහැර කිරීමේ බලය මෙම නිලධාරීන්ගේ තනි අභිමතයට පවරන ලදී. අධිකරණ අධීක්ෂණය අත්හිටුවන ලදී. බැහැර කරන ලද සිරුරු පිළිබඳ වාර්තා තබා ගැනීමට පවා ප්‍රතිපාදන නොතිබුණි."

එම වාර්තාවේ වැඩිදුරටත් මෙසේද සඳහන් විය:

"අතුරුදහන් කිරීම් ඉතා හිතාමතාම සැලසුම් කළ ප්‍රතිපත්තියක ප්‍රතිඵලයක් වූ අතර සැලැස්මකට අනුව ඉතා සූක්ෂම ලෙස ක්‍රියාත්මක කරන ලදී. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට අත්අඩංගුවට ගැනීමට, මරා දැමීමට සහ මළ සිරුරු බැහැර කිරීමට උපදෙස් ලැබුණි. හදිසි අවස්ථා රෙගුලාසි පැනවීමෙන් මෙය නීත්‍යානුකූලව කළ හැකි විය. ඝාතන සිදු කිරීමට පොලිසියට නිරන්තරයෙන් පුහුණුව ලබා දුන් අතර, එක් එක් ප්‍රදේශයේ කොපමණ සංඛ්‍යාවක් මරා දැමිය යුතුද යන්න අධීක්ෂණය කිරීමේ ක්‍රම තිබුණි. ඝාතක කණ්ඩායම් සඳහා මුදල් බෙදා හැරීම හරහා දිරි දීමනා ලබා දෙන ලදී.

එවැනි ක්‍රියාකාරකම්වලට සහභාගී වීමට හිතකර මනෝභාවයකින් තබා ගැනීම සඳහා මෙම කණ්ඩායම්වලට මත්පැන් ද ලබා දෙන ලදී. මරා දැමීමට නියමිත අයගේ ලැයිස්තු බෙදා හරින ලදී. ප්‍රශ්න කිරීම සඳහා විශේෂ ස්ථානවල විශේෂ ප්‍රශ්න කිරීම් පවත්වන ලදී. බොහෝ අවස්ථාවන්හිදී, මෙම ප්‍රශ්න කිරීම් අතරතුර මරා දැමීමට තීරණය කරන ලද අතර, මෙම ස්ථානවල රහසිගත වටපිටාව තුළ මිනිසුන් ඝාතනය කරන ලදී. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් මෙම ක්‍රියාකාරකම් සිදු කිරීමේදී නීති විරෝධී කණ්ඩායම් සමග මිශ්‍ර විය. දේශපාලනඥයින්ගේ අභිමතයන් ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි මෙම කණ්ඩායම් වෙත දේශපාලනඥයින්ට සෘජු ප්‍රවේශය ලබා දෙන ලදී."

**කොමිෂන් සභා වාර්තාව සහ වළ දැමූ ලැයිස්තු**

1988 ජනවාරි 1 න් පසු පුද්ගලයන් බලහත්කාරයෙන් ඉවත් කිරීම හෝ අතුරුදන් කිරීම් පිළිබඳ සිද්ධීන් විමර්ශනය කිරීම සඳහා 1994 නොවැම්බරයේදී ජනාධිපති කුමාරතුංග විසින් ජනාධිපති කොමිෂන් සභා තුනක් පත් කරන ලදී. මනෝරි මුත්තෙටුවේගමගේ සභාපතිත්වයෙන් යුත් කොමිසම බස්නාහිර, දකුණ සහ සබරගමුව පළාත්වල සිදුවීම් පිළිබඳව සොයා බලන ලදී.

එවකට කටුවන යුද හමුදා කඳවුරට අනුයුක්තව සිටි නිලධාරීන් පිළිබඳ තොරතුරු ලබා දෙන ලෙස කොමිෂන් සභාව කළ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් 1997 ජූනි 30 වැනි දින යුද හමුදාව ඔවුන්ගේ වාර්තාවල 'සඳහන්ව නොමැත' යනුවෙන් පිළිතුරු දුන්නේය. මෙය අනෙක් බොහෝ කඳවුරු සම්බන්ධයෙන් ප්‍රතිචාර වශයෙන් ලබා දුන් පිළිතුරම විය. එම තොරතුරු හමුදාවෙන් ලබා ගැනීමට කොමිසම වැඩිදුර පියවර ගත්තේ නැත.

මෙම අපරාධ සිදු කළ බව කියන අපරාධකරුවන් කොමිසමේ නිර්දේශවලින්ම ආරක්ෂා විය. කොමිසම "සාක්ෂිකරුවන්ගේ චෝදනාවලට පදනම් වූ තොරතුරු සහ කරුණු මූලික වශයෙන් විශ්වාස කළ හැකි" බව සොයා ගත් නමුත්, එය එසේ වුවද, වැඩිදුර විමර්ශන සිදු කරන තුරු, "අප විසින් වෙනම ආවරණයක් යටතේ එවනු ලබන බලහත්කාරයෙන් ඉවත් කිරීම් හෝ අතුරුදහන් කිරීම් සම්බන්ධයෙන් වගකිව යුතු යැයි චෝදනා ලබන පුද්ගලයන්ගේ නම් ලැයිස්තු ප්‍රකාශයට පත් නොකරන ලෙස අපි නිර්දේශ කරමු," යි කියා සිටියේය. කුමාරතුංගගේ ආන්ඩුව හෝ අනුප්‍රාප්තික ආන්ඩු විසින් එවැනි "වැඩිදුර විමර්ශන" කිසිවිටෙක සිදු නොකළ අතර, එමගින් අපරාධකරුවන්ට ජීවිතාන්තය දක්වා දණ්ඩමුක්තිය සහ වැඩිදුර අපරාධ කිරීම සඳහා ආරක්ෂාව ලබා දුන්නේය. අද දක්වාම, මෙම රහස්‍ය ලැයිස්තු සහ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මහජනතාවට අනාවරණය කර නොමැත.

ධනේශ්වර ඒකීය රාජ්‍යය සහ මූල්‍ය ප්‍රාග්ධනයේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා පසුව උතුරේ සහ නැගෙනහිර ජනවාර්ගික දෙමළ ජනතාවට එරෙහිව ඉදිරියට ගෙන ගිය දකුණේ ප්‍රතිකැරැල්ල සමයේ ක්‍රියාත්මක කළ ආන්ඩුවේ මර්දන ප්‍රතිපත්තිවල පන්ති ස්වභාවය theSocialist.lk පෙන්වා දී ඇත.

පරපෝෂිත රාජ්‍යය, එහි මිලිටරිය, පොලිසිය, නීති සහ ධනේශ්වර පන්ති පාලනය අහෝසි කිරීමෙන් තොරව ධනේශ්වර රාජ්‍යයේ මෙම කුරිරුකම් වැළැක්විය නොහැකි අතර යුක්තිය ස්ථාපිත කළ නොහැක. සමාජවාදී ප්‍රතිපත්ති සඳහා දකුනු ආසියාතික හා ජාත්‍යන්තර කම්කරු පන්තියේ ඒකාබද්ධ අරගලයේ කොටසක් ලෙස

සුලු ධනේශ්වරය සහ පීඩිත ජනතාව තම පිටුපස පෙළගස්වා ගනිමින් මේ සඳහා සටන් කිරීම කම්කරු පන්තියේ ඓතිහාසික කර්තව්‍යය යි.

**ගාසාවේ සියොන්වාදී ජන සංහාරය නවතනු!**

**අධිරාජ්‍යවාදී ණය අහෝසි කරනු!**

# ආර්ථික බුබුලු "හොඳයි" යැයි ප්‍රකෝටිපති ජෙෆ් බෙසෝස් ප්‍රකාශ කරයි

ඇන්ඩ්‍රේ ඩේමන් විසිනි.

මෙහි පලවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ) 2025 ඔක්තෝම්බර් 03 දින '**Ultra-billionaire Jeff Bezos declares economic bubbles are "good"**' යන හිසින් පලවූ ඇන්ඩ්‍රේ ඩේමන් විසින් ලියන ලද ලිපියේ සිංහල පරිවර්තනය යි.

සිකුරාදා, ලෝකයේ සිව්වන ධනවත්ම මිනිසා සහ ඇමසන් සමාගමේ නිර්මාතෘ සහ සභාපති, තාක්ෂණ කතිපයාධිකාරී ජෙෆ් බෙසෝස්, එක්සත් ජනපද ආර්ථිකය තාක්ෂණික සමාගම් කොටස් මත කේන්ද්‍රගත වූ ආර්ථික බුබුලක් මධ්‍යයේ පවතින බව කෙලින්ම පිළිගෙන එය "හොඳ" බව ප්‍රකාශ කළේය.

එක්සත් ජනපදය ආර්ථික බුබුලක් මධ්‍යයේ සිටින බවට බෙසෝස්ගේ පිළිගැනීම දශක ගණනාවක පූර්වාදර්ශයන්ගෙන් බිඳ දමයි. ප්‍රධාන සමපේක්ෂන උමතුකම් අතරතුර, ඇමරිකාවේ ප්‍රකෝටිපතියන්, ඔවුන් ආර්ථික බුබුලකට ඉන්ධන සපයන බව ප්‍රතික්ෂේප කරනු ඇති අතර, පසුව නොවැළැක්විය හැකි බිඳවැටීම දෙවියන්ගේ අනපේක්ෂිත ක්‍රියාවක් ලෙස හුවා දක්වමින්, මානව වර්ගයාගේ පොදු යහපත සඳහා යැයි කියමින් රජයේ ඇපකර ඩොලර් ට්‍රිලියන ගණනක් එකතු කර ගනු ඇත.

2008 දී එක්සත් ජනපද රජය ඩොලර් ට්‍රිලියන 30 කට වැඩි මූල්‍ය වත්කම්වල වටිනාකම් ඉහළ නැංවීම සඳහා හදිසි කොන්දේසි මත ඩොලර් ට්‍රිලියන 7 කට වඩා ණයට දුන් විට වූ තිර රචනය මෙය විය. 2020 දී බයිඩන් සහ ට්‍රම්ප් පරිපාලනයන් COVID-19 වසංගතය යොදා ගනිමින් "Cares Act" සහ හදිසි ෆෙඩරල් සංචිත බැංකුවේ මැදිහත්වීම හරහා අධික ලෙස උත්තෝලනය කරන ලද (over-leveraged) බැංකු සහ සංගතවලට ඩොලර් ට්‍රිලියන ගණනක් මාරු කිරීමට කඩතුරාවක් ලෙස භාවිතා කළ විට එය නැවත නැවතත් සිදු විය.



2025 ජනවාරි 20 වන සඳුදා වොෂින්ටනයේ එක්සත් ජනපද කැපිටල් හි රොටුන්ඩා හි 60 වන ජනාධිපති පදවි ප්‍රාප්තිය ඉදිරිපිට වමේ සිට මාර්ක් සකර්බර්ග්, ලෝරන් සැන්චෙස්, ජෙෆ් බෙසෝස් සහ සුන්දර් පිචායි. [AP ඡායාරූපය/කෙනී හොල්ස්ටන්/ද නිව් යෝර්ක් ටයිම්ස්]

තාක්ෂණ සමාගම් සඳහා කොටස් වටිනාකම්වල දැවැන්ත වැඩිවීම ගැන සඳහන් කරමින් බෙසෝස් ප්‍රකාශ කළේ, "මෙය එක්තරා ආකාරයක කාර්මික බුබුලක්" බවයි.

තාක්ෂණික කොටස්වල බුබුලක් ඇති බව පිළිගැනීමේදී, බෙසෝස් ප්‍රතික්ෂේප කළ නොහැකි ලෙස නිවැරදිය. බරපතල මූල්‍ය විශ්ලේෂකයින් අතර, සෑම අනතුරු ඇඟවීමේ ලකුණක්ම රතු පැහැයෙන් දැල්වෙමින් පවතී. නොසැලකිය හැකි ඉපැයීම් ඇති තාක්ෂණ සමාගම්, වඩාත්ම ශුභවාදී අවස්ථාවන්හිදී පවා ඉටු කළ නොහැකි උපකල්පන මත පදනම්ව ආයෝජන සිදු කිරීමට සැලසුම් කරයි. වෝල් ස්ට්‍රීට් ජර්නලයේ මෑත ලිපියක සඳහන් වූයේ, ප්‍රමුඛ පෙළේ තාක්ෂණ සමාගම්, දශක හතරක් පුරා එක්සත් ජනපද අන්තර් ප්‍රාන්ත මහාමාර්ග පද්ධතිය ගොඩනැගීමේ පිරිවැයට වඩා වැඩි මුදලක්, AI දත්ත මධ්‍යස්ථාන සහ ඒ ආශ්‍රිත තාක්ෂණයන් ගොඩනැගීම සඳහා පොරොන්දු වී ඇති බවයි.

බේන් සහ සමාගම විසින් මෑතකදී කරන ලද විශ්ලේෂණයකින් ඇස්තමේන්තු කර ඇත්තේ, AI මත පදනම් වූ මෘදුකාංග සඳහා වත්මන් වාර්ෂික ආදායම වන ඩොලර් බිලියන 45 ට සාපේක්ෂව, යටිතල පහසුකම් වියදම්වල වත්මන් රැල්ල සඳහා ගෙවීමට වාර්ෂික ආදායම ඩොලර් ට්‍රිලියන 2 ක් අවශ්‍ය වනු ඇති බවයි. මෙම 40 ගුණයකින් වැඩි වීම කෙසේ සිදුවනු ඇත්දැයි කිසිවෙකු දන්නේ නැත.

නමුත් ඔහුගේ සමාගම වැනි තාක්ෂණ සමාගම්වල වත්කම් වටිනාකම් දැවැන්ත ලෙස අධිතක්සේරු කිරීම හොඳ දෙයක් බව බෙසෝස් පැවසීය. කාර්මික බුබුලු "හොඳ වෙන්නත් පුළුවන්, මොකද දූවිලි තැන්පත් වෙලා

[බුබුල පුපුරා යාමෙන් පසු] ජයග්‍රාහකයින් කවුද කියලා ඔබ දකිනකොට, සමාජයට ඒ නව නිපැයුම් වලින් ප්‍රතිලාභ ලැබෙනවා... ඒ වගේම මෙතන සිද්ධ වෙන්න යන්නේ ඒකයි."

ඇමරිකානු ඉතිහාසය එවැනි "කාර්මික බුබුලු" වලින් පිරී තිබේ. එයින් වඩාත්ම වැදගත්ම එක වූයේ 1920 ගණන්වල "ගර්ජනාත්මක" කාර්මික හා තාක්ෂණික ධාරිතාවයේ දැවැන්ත අධික-ආයෝජනයයි; එය 1929 මූල්‍ය බිඳවැටීමට අවසාන හේතුව වූ අතර මහා අවපාතයට ප්‍රධාන දායකත්වයක් ලබා දුන්නේය. මෙම කාලාවර්තක බුබුලු සෑම විටම වංචාකරුවන්ගේ පොහොසත් වීමට සහ කම්කරු ජනතාව දුප්පත් කිරීමට හේතු වී තිබේ.

නමුත් මෙය 1920 ගණන්වල හෝ 1930 ගණන්වල නොවේ. ඒ කාලයේ දී, වෙළඳපොළවල් තමන්වම "පිරිසිදු" කර ගැනීමට ඉඩ දීම ආර්ථික සම්ප්‍රදාය විය. බැංකුකරු ඇන්ඩෲ මෙලන්ගේ ආදර්ශ පාඨය වූයේ: "ශ්‍රමය ඈවර කරන්න, කොටස් ඈවර කරන්න, ගොවීන් ඈවර කරන්න, දේපළ ඈවර කරන්න. එය පද්ධතියෙන් කුණුවීම ඉවත් කරනු ඇත."

මෙම දැක්ම එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතය විසින් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කර ඇත. නිල ආර්ථික විද්‍යාවේ සමස්ත රාමුවම, හිතකර අනුපාත යටතේ අසීමිත ණය ලබා දීම පමණක් නොව, බැංකු සහ සංගතවලට ලබාදෙන සෘජු රජයේ ඇපකර හරහා ද මූල්‍ය අර්බුද ඕනෑම වියදමකින් සමනය කළ යුතු බවට ප්‍රකාශ කිරීමට මාරු වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය බුබුලු බිඳවැටීමේ විභවය ප්‍රධාන සංගතවල කොටස් පත්‍රවලට පමණක් නොව, එක්සත් ජනපද රජයේ, එහි මහ බැංකුවේ සහ සමස්ත ඩොලර් මත පදනම් වූ මූල්‍ය පද්ධතියේ නුබුන්වත්කමට ද තර්ජනය කරයි.

2008 සහ 2020 දී මෙම ඇපකර මගින් බෙසෝස්ගේම ධනයේ දැවැන්ත වැඩිවීමක් සඳහා කොන්දේසි නිර්මානය කරන ලදී. 2007 දී බෙසොස්ගේ ශුද්ධ වත්කම ඩොලර් බිලියන 8.7 ක් විය. 2008 බිඳවැටීමෙන් වසර 10 කට පසු, 2018 වන විට ඔහුගේ ධනය ඩොලර් බිලියන 161 දක්වා ඉහළ ගොස් තිබුණි. එතැන් සිට එය තවදුරටත් වර්ධනය වීම පමණක් සිදු වී ඇත අතර, වර්තමානයේ මුළු වත්කම ඩොලර් බිලියන 250 කි.

ජනක AI (generative AI) හි යටින් පවතින ආර්ථික සංවර්ධනය සමාජයට ප්‍රතිලාභ ලබා දෙන බවට වන පදනම මත බෙසෝස් මූල්‍ය වත්කම්වල වර්තමාන අධි තක්සේරුව ආරක්ෂා කරයි. නිසැකවම, සමාජවාදය ලෙස හැඳින්වෙන සමාජයට ප්‍රතිලාභ ලබා දීම සඳහා සංවිධානය කරන ලද ආර්ථික පද්ධතියක, ජනක AI දැවැන්ත ධනාත්මක බලපෑමක් ඇති කරනු ඇත. නමුත් ධනවාදය යටතේ, ජනක AI හි දැවැන්ත ශ්‍රම ඉතිරි කිරීමේ බලයේ බලපෑම ප්‍රධාන වශයෙන් සමස්ත ශ්‍රම පන්තිින් ප්‍රතිස්ථාපනය කිරීම, විරැකියාව ඉහළ නැංවීම, වැටුප් පහත හෙළීම සහ ආර්ථික අසමානතාවය වැඩි කිරීමයි.

කෙසේ වෙතත්, බුබුල AI වලට පමණක් සීමා නොවන බව බෙසෝස් දනී. ගෝලීය ක්‍රිප්ටෝ මුදල් වෙළඳපොළ ඩොලර් ට්‍රිලියන 4 ක තක්සේරුවකට ලක්ව ඇති අතර, බිට්කොයින් ඩොලර් බිලියන 47 කින් ඉහළ ගොස් ඇත. ජනක AI මෙන් නොව, ක්‍රිප්ටෝ මුදල් අපරාධ සහ මුදල් විශුද්ධිකරණයෙන් පිටත කිසිදු වැදගත් භාවිතයක් ඇති බව කිසි විටෙකත් පෙන්වා නැත.

AI බුබුල පමණක් නොව ක්‍රිප්ටෝ මුදල් බුබුල ද නොවැළැක්විය හැකි දියවීමකට ලක් වූ විට රජයන්ගේ ප්‍රතිචාරය කුමක් වේද? ට්‍රම්ප්ගේ සෙසු කතිපයාධිකාරීන්ට ඇප ලබා දීම සඳහා අතිවිශාල හා පෙර නොවූ විරූ නව මුදල් ලබා දෙමින් ට්‍රම්ප් රජය වහාම ක්‍රියාත්මක වනු ඇත.

මෙම ඇපදීම සඳහා ගෙවනු ලබන්නේ කෙසේද යන ප්‍රශ්නය මෙය මතු කරයි. එක්සත් ජනපද ෆෙඩරල් ණය ඩොලර් ට්‍රිලියන 37 දක්වා ළඟා වී ඇති අතර, ණය-දළ දේශීය නිෂ්පාදිත අනුපාතය එක්සත් ජනපද ඉතිහාසයේ ඉහළම මට්ටමේ පවතී. ඩොලරයේ නුබුන්වත්භාවය පිළිබඳ වෙළඳපල අවිනිශ්චිතතාවයට විකල්පයක් වන රත්‍රන්වල මිල ඩොලර් 3,900 දක්වා ළඟා වී ඇති අතර එය මාස හයක් තුළ සියයට 25 කින් ඉහළ ගොස් තිබේ.

යථාර්ථය නම්, මූල්‍ය කතිපයාධිකාරීන් පැත්තෙන් ඔවුන්ගේ ධනය තිරසාර නොවන මූල්‍ය බුබුලකින් ආධාරක වන බවට ඇති දැනුම, සමාජ වියදම් කප්පාදු කිරීමට, ලක්ෂ සංඛ්‍යාත ෆෙඩරල් සේවකයින් සේවයෙන් පහ කිරීමට සහ ප්‍රධාන හිමිකම් වැඩසටහන් – මෙඩිකෙයාර්, මෙඩිකේඩ් සහ සමාජ ආරක්ෂණය – විනාශ කිරීමට ට්‍රම්ප් පරිපාලනය දරන ක්‍රමානුකූල උත්සාහයන් පිටුපස පවතී. බුබුල අනිවාර්යයෙන්ම පුපුරා යන විට ඔවුන්ගේ බොල් ණය වලට ඇප තැබීමට මෙම මුදල් අවශ්‍ය වන බව ඔවුන් සම්පූර්ණයෙන්ම දනී.

තව දුරටත් ධනය මහත් ලෙස ඉහළට යලි බෙදාහැරීමකට මහජන විරෝධයක් ඇති වනු ඇති බව කතිපයාධිකාරීන් ඒ හා සමානව හොඳින් දනී. ජනාධිපති ආඥාදායකත්වයක් ස්ථාපිත කිරීමට ට්‍රම්ප් දරන උත්සාහයට ඔවුන්ගේ සහයෝගය පිටුපස ඇත්තේ මෙයයි.

# අධිරාජ්‍යවාදය තම “අවසාන විසඳුම” ගාසා තීරයේ දියත් කරයි

ලෝසවෙ ජාත්‍යන්තර කතෘ මණ්ඩලය විසිනි.

මෙහි පලවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ) 2025 මැයි 19 දින ‘**Imperialism launches its “final solution” in Gaza**’ යන හිසින් පලවූ ලෝසවෙ ජාත්‍යන්තර කතෘ මණ්ඩලය විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.



2025 මැයි 19 වන සඳුදා, ඊශ්‍රායල හමුදා ප්‍රහාරය මධ්‍යයේ, ගාසා තීරයේ ඛාන් යුනිස් ප්‍රදේශයෙන් අවතැන් වූ පලස්තීනුවන් පලා යති [AP ඡායාරූපය/අබ්දෙල් කරීම් හනා]

සති අන්තයේ ඊශ්‍රායල ආරක්ෂක හමුදා (IDF) විසින් “ගිඩියොන්ගේ යුධරථ මෙහෙයුම” පූර්ණ පරිමාණයෙන් දියත් කිරීම නිවේදනය කරන ලද අතර එය ගාසා තීරයේ “අවසාන පියවර” ලෙස අගමැති බෙන්ජමින් නෙතන්යාහු විස්තර කළේය. මෙම භාෂාව “අවසාන විසඳුම” – යුරෝපයේ යුදෙව්වන් ක්‍රමාණුකූලව සමූලඝාතනය කිරීම සඳහා නාසි ජර්මනියේ යෙදුම - ප්‍රතිරාවය කරයි.

මෙහෙයුමේ අරමුන වන්නේ ගාසා තීරය මුළුමනින්ම මිලිටරි ආක්‍රමණය කිරීම සහ අත්පත් කර ගැනීම, ඉතිරි ජනගහනය දකුණේ ගාල් කඳවුරුවලට බලහත්කාරයෙන් අභ්‍යන්තර විස්ථාපනය කිරීම සහ ඔවුන් පලස්තීනයෙන් මුළුමනින්ම නෙරපා හැරීමට සූදානම් වීමයි.

මෙම මෙහෙයුම සමග සමගාමීව සිරගත කර සිටින ජනගහනයට ආහාර බෙදා හැරීම, එක්සත් ජනපදය-ඊශ්‍රායලය ඒකාබද්ධව අත්පත් කර ගැනීමත්, ඇමරිකානු සැපයුම් සමාගම් සහ පුද්ගලික හමුදා කොන්ත්‍රාත්කරුවන් විසින් මුහුණ හඳුනාගැනීමේ තාක්ෂණය හරහා හඳුනාගෙන පූර්ව පරීක්ෂාවට ලක් වූ පුද්ගලයින්ට සාගත මට්ටමේ සලාක බෙදාහැරීමත් සිදුකරනු ඇත.

තිරය පිටුපසින් ට්‍රම්ප් පරිපාලනය, හොලෝකෝස්ට සමූලඝාතනයෙන් [දෙවන ලෝක යුද්ධ සමයේ දී හිට්ලර් ප්‍රමුඛ ෆැසිස්ට්වාදින් සිදුකළ මිලියන් 6 ක යුදෙව් ජන සංහාරය] පසු විශාලතම අධිරාජ්‍යවාදී පිටුබලය සහිත වාර්ගික ශුද්ධ කිරීමේ මෙහෙයුම මෙහෙයවයි. බලහත්කාරයෙන් අවතැන් කරන මිලියනයකට අධික පලස්තීනුවන් නැව් මගින් හෝ ගොඩබිමෙන් භාර ගැනීම සඳහා – එක්සත් ජනපදයේ පිටුබලය ලබන ඉස්ලාමීය කැරලිකරුවන් විසින් පෙරලා දැමූ ආන්ඩු සහිත – ලිබියාවේ සහ සිරියාවේ පාලන තන්ත්‍රයන් සමඟ ධවල මන්දිරය සාකච්ඡා කරමින් සිටී.

දෙවන ලෝක යුද්ධය අවසන් වීමෙන් වසර අසූවකට පසුව, නාසි ජර්මනියේ දැවැන්තම අපරාධ – මහා පරිමාන සමූල ඝාතනය, හිතාමතා මහා පරිමාන සාගතය සහ වාර්ගික ශුද්ධ කිරීම – අධිරාජ්‍යවාදී බලවතුන් විසින් ක්‍රියාත්මක කර සාමාන්‍යකරණය කරමින් සිටී.

එහෙත් හොලෝකෝස්ටයේ සැලසුම්කරුවන් ඔවුන්ගේ අපරාධවල පරිමාණය ජර්මානු ජනගහනයෙන් සහ ලෝකයෙන් වසන් කිරීමට උත්සාහ කළ අතර, ගාසා තීරයේ සමූල ජන ඝාතනය මුළුමනින්ම එළිපිටම දිග හැරෙමින් තිබේ. ඇමරිකානු ජනාධිපතිවරයා පලස්තීනය ජනවාර්ගික ශුද්ධ කිරීම සහ ඈඳා ගැනීම තම පරිපාලනයේ මූලෝපායික අරමුණක් ලෙස විවෘතව ප්‍රකාශ කර ඇත.

ගාසා තීරයේ ජන සංහාරය ට්‍රම්ප් සහ නෙතන්යාහු විසින් මෙහෙයවනු ලැබුව, එය සියලු අධිරාජ්‍යවාදී බලවතුන් විසින් ආරක්ෂා කර නීත්‍යානුකූල කර ඇති අතර ධනේශ්වර අරාබි පාලන තන්ත්‍රයන් විසින් ඊට පහසුකම් සලසා ඇත.

අධිරාජ්‍යවාදී ආන්ඩු ඊශ්‍රායලයට “තමන්ව ආරක්ෂා කර ගැනීමට අයිතියක් ඇති” බව ප්‍රකාශ කිරීම මගින් සමූහ මිනීමැරුම් සහ වාර්ගික ශුද්ධ කිරීම් නීත්‍යානුකූල කරයි. යුරෝපය පුරා සෑම ආන්ඩුවක්ම ජන සංහාරයට එරෙහි විරෝධතා වංචනිකව “සෙමිටික් (යුදෙව්)-විරෝධී” ලෙස හෙලා දැක, සමූහ අත්අඩංගුවට ගැනීම් සිදු කරමින් සහ ඊශ්‍රායල රාජ්‍යයේ අපරාධවලට

එරෙහිව කතා කරන අයට හිංසා පීඩා කරමින් සිටී.

ජර්මානු චාන්සලර් ෆ්‍රෙඩ්රික් මර්ස්, ඊශ්‍රායල අගමැති බෙන්ජමින් නෙතන්යාහුට ජර්මනියට ආරාධනා කර ඇති අතර, නෙතන්යාහු අත්අඩංගුවට ගැනීම සඳහා ජාත්‍යන්තර අපරාධ අධිකරණය විසින් නිකුත් කරන ලද වරෙන්තුව කඩ කරන බවට ප්‍රතිඥා දී තිබේ.

සෞදි අරාබිය, කටාර් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙත ට්‍රම්ප්ගේ සංචාරය ගාසා ජන සංහාරයේ අරාබි පාලන තන්ත්‍රවල හවුල්කාරිත්වය සමස්ත ලෝකය ඉදිරියේ ප්‍රදර්ශනය කර ඇත. ගාසා තීරයේ විනාශය වෙනුවෙන් ට්‍රම්ප් ඊශ්‍රායලයට ඩොලර් බිලියන ගණනින් බෝම්බ ලබා දෙද්දී කටාර් රජ පවුල ට්‍රම්ප්ට ඩොලර් මිලියන 400 ක පෞද්ගලික ජම්බෝ ජෙට් යානයක් තෑගි කර තිබේ.

පලස්තීනුවන් සාගතයේ තැබීම හෙළා දකින නාම මාත්‍ර ප්‍රකාශ නිකුත් කළ ද, අරාබි පාලන තන්ත්‍ර ගාසා තීරයේ සමූල ජන සංහාරයට සහ බලහත්කාරයෙන් අවතැන් කිරීමට හවුල්කාරී වේ.

මාධ්‍යවේදී බොබ් වුඩ්වර්ඩ් යුද්ධය නම් සිය පොතේ සඳහන් කර ඇති පරිදි , ජෝර්දානයේ දෙවන අබ්දුල්ලා රජු 2023 දී රාජ්‍ය ලේකම් ඇන්ටනි බ්ලින්කන්ට පැවසුවේ, "ඊශ්‍රායලය හමාස් පරාජය කළ යුතුය. අපි මෙය ප්‍රසිද්ධියේ නොකියමු, නමුත් අපි හමාස් පරාජයට සහාය දෙමු." ඊශ්‍රායලය පලස්තීනුවන් සමූල ඝාතනය කරමින් සිටියදී පවා ඔහුගේ පාලනයට අවශ්‍ය වන්නේ ඊශ්‍රායලය සමඟ සාමය පවත්වා ගැනීමට පමණක් බව ඊජිප්තු ජනාධිපති අබ්දෙල් ෆාටා එල්-සිසි බ්ලින්කන්ට පැවසූ බවත් වුඩ්වර්ඩ් ලිවීය.

"ජාත්‍යන්තර නීතියේ" ආයතන සිදුවෙමින් පවතින සමූල ජන සංහාරය හමුවේ සම්පූර්ණයෙන්ම බංකොලොත් බව ඔප්පු කර ඇත. අඩ සියවසක අධිරාජ්‍යවාදී අනුග්‍රහය ලත් "සාම සැලසුම්", එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සහ ආරක්ෂක මණ්ඩලයේ ගණන් කළ නොහැකි ඡන්ද, ජාත්‍යන්තර අධිකරණයේ තීන්දු සහ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ චෝදනා සම්පූර්ණයෙන්ම අර්ථ විරහිත බව ඔප්පු වී ඇත.

යෝධ පරිමාණ අපරාධයක් වන ගාසා තීරයේ දිග හැරෙමින් පවතින දෙය අතිශය දුරදිග යන දේශපාලන ඇඟවුම් දරා සිටී. එය අධිරාජ්‍යවාදයේ සහ සියලු "ප්‍රජාතන්ත්‍රවාදී" ධනේශ්වර ආණ්ඩුවල අති මූලික ස්වභාවය හෙලිදරව් කරයි. පළමු ලෝක යුද්ධය මධ්‍යයේ 1916 දී ලියන ලද අධිරාජ්‍යවාදය පිළිබඳ ඔහුගේ නොනැසෙන සුළු විග්‍රහයේ දී, ලෙනින් අනතුරු ඇඟවූයේ, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය සහ පැරණි රාජාණ්ඩු ආඥාදායකත්වය අතර වෙනස මැකී යමින් පවතින බවයි. ශතවර්ෂයකට පසුව, මානව හිමිකම් ආරක්ෂා කරන්නන් යැයි කියා ගන්නා නවීන අධිරාජ්‍යවාදී පාලන තන්ත්‍ර, සමස්ථ ජනගහණයක් සමූල ඝාතනය කිරීම, යුක්ති සහගත කිරීම, සහාය දීම සහ ඊට අත්පොළසන් දීම පවා කරති.

සමූල ජන ඝාතනය සාමාන්‍යකරණය කිරීම, ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එරෙහි ප්‍රහාර තීව්‍ර කිරීම, කම්කරු පන්තිය දුප්පත් කිරීම සහ අධිරාජ්‍යවාදී ආන්ඩුවල යුද සැලසුම් වලින් වෙන් කළ නොහැකි සංරචකයකි. වොෂින්ටනයේ සිට බර්ලින්, ලන්ඩන් සහ ටෝකියෝ දක්වා සියලුම අධිරාජ්‍යවාදී අගනගරවල ආන්ඩු සමාජ වැඩසටහන් කප්පාදු කරමින් මිලිටරි වියදම් දැවැන්ත ලෙස පුලුල් කරමින් සිටී.

සෑම අධිරාජ්‍යවාදී ආන්ඩුවකම නායකයින් – සහ ඔවුන්ගේ මැද පෙරදිග අනුගාමික පාලන තන්ත්‍රයන් – ඊශ්‍රායලය විසින් සිදු කරන ලද සමූල ජන ඝාතනයට සහාය දෙන අතර, ලෝක ජනගහනයෙන් අතිමහත් බහුතරයක් මෙම අපරාධ වලින් කම්පනයට පත්ව සිටිති. ලොව පුරා ප්‍රධාන නගරවල සහ උප නගරවල- ගණන් කළ නොහැකි දහස් ගණන් යුදෙව්වන් ද ඇතුළු- මිලියන සංඛ්‍යාත ජනයා ගාසා සමූල ජන ඝාතනයට එරෙහි මහජන විරෝධතාවලට සම්බන්ධ වී සිටිති. සමූල ජන ඝාතනයෙන් කෝපයට පත් ලෝක ජනතාව සහ ඔවුන්ගේ ආන්ඩු අතර සමහන් කළ නොහැකි අගාධයක් විවර වී ඇත.

සමූල ජන ඝාතනය ආරම්භයේ සිට මාස දහනවයක් ගත වන විට, යම් මූලික නිගමනවලට එළඹීම අවශ්‍ය වේ. ප්‍රථමයෙන් සහ ප්‍රධාන වශයෙන්, අධිරාජ්‍යවාදී බලවතුන්ට හෝ ජාත්‍යන්තර නීති ආයතනවලට ආයාචනා කිරීම හරහා ගාසා සමූල ජන ඝාතනය නැවැත්විය නොහැක. ගාසා තීරයේ සංහාරය නැවැත්විය හැකි එකම මාර්ගය කම්කරු පන්තිය බලමුලු ගැන්වීමයි. සමූල ජන ඝාතනයට එරෙහි අරගලය රඳා පවතින්නේ පන්ති අරගලයේ පුළුල් කිරීම සහ කම්කරු පන්තියේ සමාජ, ආර්ථික හා දේශපාලන අයිතීන් ආරක්ෂා කිරීම මත ය.


- **ඊශ්‍රායලයට ආයුධ නැව්ගත කිරීම වහා නවතනු!**
- **ඊශ්‍රායලය සමඟ සියලුම වෙළඳ සහ අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම් වර්ජනය කරනු!**
- **ජන සංහාරය සිදුකිරීමට ඊශ්‍රායලයට සහාය වන එක්සත් ජනපද, යුරෝපීය සහ අනෙකුත් සංස්ථාවලට චෝදනා ගොනු කර නඩු පවරනු!**
- **යුද අපරාධ සම්බන්ධයෙන් නෙතන්යාහු සහ අනෙකුත් ඊශ්‍රායල නිලධාරීන් අත්අඩංගුවට ගනු!**
- **ගාසා ජන සංහාරයට එරෙහි විරෝධය මර්දනය නතර කරනු!**
- **ජීවිතාරක්ෂක ආධාර සඳහා ගාසාවට ක්ෂණික සහ බාධාවකින් තොරව ප්‍රවේශය ලබා දෙනු!**

# ඕගස්ට් බෙබෙල් සහ කම්කරු පන්තියේ දේශපාලන පිබිදීම

"ඕගස්ට් බෙබෙල් සහ කම්කරු පන්තියේ දේශපාලන පිබිදීම" – August Bebel and the political awakening of the working class – යන මෙම ලිපිය ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නිර්මාතෘ වන ඕගස්ට් බෙබෙල්ගේ මරණයෙන් සියවන සංවත්සරය නිමිත්තෙන් 2013 අගෝස්තු මස ලෝක සමාජවාදී වෙබ් අඩවියට උල්රිච් රිපර්ට් විසින් ලියන ලද එකකි. එය සිංහලට පරිවර්තනය කොට අපි අප පක්ෂයේ (සසප) සහෝදරවරුන්ගේත්, කම්කරුවන්ගේත් අවධානය සඳහා මෙහි පළකරමු.

ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (SPD) මුල් ඉතිහාසය, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (ICFI) කේඩරය සඳහා තීරණාත්මක පාඩම් ගෙන එයි. 1869 දී ඕගස්ට් බෙබෙල් සහ විල්හෙල්ම් ලිබ්නෙක්ට් විසින් – මාක්ස් සහ එංගල්ස්ගේ දේශපාලන මග පෙන්වීම යටතේ – ආරම්භ කරන ලද SPD, විද්‍යාත්මක සමාජවාදයේ මූලධර්ම මත පදනම්ව කම්කරු පන්තියේ මහජන විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගීමේ පළමු අඛණ්ඩ උත්සාහය නියෝජනය කළේය. එය ජර්මනිය පුරා ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන් දැනුවත් කර සංවිධානය කළ අතර, ධනවාදයේ මිනීවළවල් හාරන්නන් ලෙස ඔවුන්ගේ ඓතිහාසික භූමිකාව පිළිබඳ සවිඥානකත්වයක් ඔවුන් තුළ ඇති කළේය.

උල්රිච් රිපර්ට්ගේ ලිපිය, ඕගස්ට් බෙබෙල් සහ කම්කරු පන්තියේ දේශපාලන පිබිදීම පිලිබද මෙම ඉතිහාසයට වටිනා ප්‍රවේශ ලක්ෂ්‍යයක් සපයයි. එය දක්ෂ කම්කරුවෙකුගේ සිට මාක්ස්වාදී නායකයෙකු සහ කම්කරු පන්තියේ විප්ලවවාදී අධ්‍යාපනඥයෙකු දක්වා බෙබෙල්ගේ පෞද්ගලික ගමන් පථය කෙරෙහි අවධානය යොමු කරයි. නමුත් චරිතාපදානයකට වඩා, ලිපිය ලෝක ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් ඉස්මතු කරයි: එනම්, කම්කරු පන්තිය දේශපාලනිකව ස්වාධීන බලවේගයක් ලෙස මතුවීම යි.



ඕගස්ට් බෙබෙල්, 1900 දී

කෙසේ වෙතත්, පළමුවන ලෝක යුද්ධය පුපුරා යාමේදී ජර්මානු අධිරාජ්‍යවාදයට සහාය දීමට 1914 යුද ණය සඳහා පක්ෂ වෙමින් SPD ය කළ පාවාදීමෙන් කූටප්‍රාප්තියට පත් වූ එහි පරිහානිය, අනුභූතිවාදය (empiricism) සහ මතුපිට පෙනුමට යටත් වීම තුළ මුල් බැසගත් ජාතික අවස්ථාවාදයේ මාරාන්තික ප්‍රතිවිපාක හෙළි කළේය. එස්පීඩී නායකත්වය ගත් තීරණය අහම්බයක් හෝ පුද්ගල දුර්වලතාවයක ප්‍රතිඵලයක් නොව, මාක්ස්වාදී මූලධර්මවලින් දීර්ඝ කාලයක් පසුබැසීමක ප්‍රතිඵලයකි.

මෙම පරිහානියේ හදවතේ තිබුණේ අනුභූතිවාදයට හැරීමයි – එය යටින් පවතින පන්ති ප්‍රතිවිරෝධතා විශ්ලේෂණය කිරීම වෙනුවට ක්ෂණික පෙනුම සහ මතුපිට කරුණු මතු කරන ක්‍රමයකි. මෙය SPD නායකත්වය ජාතික රාජ්‍යයට, නෛතික පාර්ලිමේන්තු රාමුවලට සහ ක්‍රමයෙන් ප්‍රතිසංස්කරණය කිරීමේ මිත්‍යාවන්ට අනුවර්තනය වීමට හේතු විය. එහි ප්‍රතිඵලය වූයේ නිර්ධන පංති ජාත්‍යන්තරවාදය අතහැර දැමීම, පක්ෂය ධනේශ්වරයේ අවශ්‍යතාවලට යටත් කිරීම සහ එය විප්ලවයට බාධාවක් බවට පරිවර්තනය වීමයි.

ජාත්‍යන්තර කමිටුවේ කේඩරය අත්‍යවශ්‍ය පාඩම උකහා ගත යුතුය: විප්ලවවාදී, ජාත්‍යන්තරවාදී සහ අපෝහක ඉදිරිදර්ශනයක් පවත්වා ගැනීමේ සටන සඳහා කිසිදු මහජන සහයෝගයක් හෝ ඓතිහාසික කීර්තියක් ආදේශ කළ නොහැක. එබැවින් රිපර්ට්ගේ ලිපිය SPD හි නැගීම හා පරිහානිය පිළිබඳ ක්‍රමානුකූල අධ්‍යයනයට පූර්විකාවකි – අද විප්ලවවාදී පක්ෂය ගොඩනැගීමට කැපවී සිටින විප්ලවවාදීන්ට මෙම ඉතිහාසය අත්‍යවශ්‍ය පාඩම් ගෙන දේ.

***

ඕගස්ට් බෙබෙල් මිය ගියේ වසර 100 කට පෙර මේ මාසයේය. ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (SPD) නිර්මාතෘ 1913 අගෝස්තු 13 වන දින ස්විට්සර්ලන්තයේ පැසුග් ස්පා නගරයේ දී හෘදයාබාධයකින් මිය ගිය බවට වූ පුවත ලොව පුරා කර්මාන්තශාලා සහ කම්කරු පන්ති දිස්ත්‍රික්කවල කම්පනයක් සහ ශෝකයක් ඇති කළේය. බෙබෙල් වැඩ කරන ජනතාව විසින් ආදරය කරන ලද අතර "කම්කරු කයිසර්" යන පදවි නාමයෙන් ගෞරවයට පාත්‍ර විය.

එයට ආසන්නයේම බෙබෙල්ට උපහාර දක්වමින් ලියොන් ට්‍රොට්ස්කි මෙසේ ලිවීය: "යුරෝපීය සමාජවාදයේ සමස්ත යුගයක්ම ගෙවී යමින් තිබේ." බෙබෙල් "නැගෙමින් පවතින නව පන්තියේ මුරණ්ඩු සහ නොසැලෙන ව්‍යාපාරය මූර්තිමත් කළේය... මෙම දුර්වල හා මැලවී වී ගිය මහලු මිනිසා මුළුමනින්ම අධිෂ්ඨානයෙන් සාදන ලද, තනි ඉලක්කයක් කරා පුහුණු කරන ලද බවක් පෙනෙන්නට තිබුණි. ඔහුගේ චින්තනයේ, ඔහුගේ ප්‍රකාශනයේ ව්‍යක්තභාවයේ සහ ඔහුගේ සාහිත්‍ය කෘති තුළ, එම ඉලක්කය කරා කෙලින්ම යොමු නොවූ බුද්ධිමය ශක්තියේ ක්ෂය වීමක් සඳහා ඔහු කිසි විටෙකත් ඉඩ නොදෙනු ඇත; ඔහු වාගාලංකාරයේ සතුරෙකු පමණක් නොව, ගර්විත සෞන්දර්යාත්මක හැඩ දැමීමටද සම්පූර්ණයෙන්ම ආගන්තුක විය. ඒ සමගම ඔහුගේ දේශපාලන ආත්මයේ ඉහළ සුන්දරත්වය ඒ තුළ ගැබ්ව තිබුණි. ඔහු තුළින්ම ඔහු පිළිබිඹු කලේ, තම නිදහස් පැය කිහිපය තුළ ඉගෙන ගන්නා, සෑම මිනිත්තුවක්ම අගය කරන සහ අත්‍යවශ්‍යම දේ ගිජු ලෙස ගිල ගන්නා පන්තියයි." [ දේශපාලන පැතිකඩ: යුගයක් ගෙවී යයි (බෙබෙල්, ෂොරෙස් සහ වයිලන්ට්), දෙසැම්බර් 1915-[Political Profiles: An Epoch Passes (Bebel, Jaurès and Vaillant), December 1915]

ට්‍රොට්ස්කි, බෙබෙල්ව පළමු ලෝක යුද්ධය ආසන්නයේ පැරිසියේ අවන්හලකදී ඝාතනය කරන ලද ප්‍රංශ සමාජවාදී ෂෝන් ෂොරෙස් (Jean Jaurés) සමඟ සංසන්දනය කළේය. ෂොරෙස් - න්‍යායික පාණ්ඩිත්‍යය, කාව්‍යමය මනඃකල්පිතය සහ වංශාධිපති විලාසයෙන් සලකුණු වූ ලේඛන සහ දේශන පිලිබඳ ප්‍රංශ දර්ශනවාද මහාචාර්යවරයා සහ ජර්මානු හස්ත කර්මාන්තකරුවෙක් වීම නිසා ප්ලෙබියානු (plebean) ප්‍රජාතන්ත්‍රවාදයට සමාන න්‍යායික දෘෂ්ටියක් තිබූ - බෙබෙල් යන දෙදෙනාම වසර 100 කට පෙර යුද්ධය සමග අවසන් වූ ඓතිහාසික කාල පරිච්ඡේදය සංකේතවත් කළහ.

ට්‍රොට්ස්කි මෙසේ සඳහන් කළේය: "බෙබෙල් භෞතිකවාදියෙක්, ෂොරෙස් සාරසංග්‍රහවාදී විඥානවාදියෙක් (eclectic idealist), බෙබෙල් මාක්ස්වාදයේ මූලධර්මවල නොසැලෙන ආධාරකරුවෙක්, ෂොරෙස් ප්‍රතිසංස්කරණවාදියෙක්, අමාත්‍යවාදියෙක් යනාදී වශයෙන්. නමුත් දේශපාලනයේ මේ සියලු වෙනස්කම් තිබියදීත්, ඔවුන් ජර්මානු සහ ප්‍රංශ සංස්කෘතියේ ප්‍රිස්මය හරහා එකම ඓතිහාසික යුගයක් පිළිබිඹු කළහ. මෙය ජාත්‍යන්තර සබඳතාවල මෙන්ම දේශීය සබඳතාවල ද- සන්නද්ධ සාමයේ යුගය විය."

මාක්ස් සහ එංගල්ස්ගේ සමීපතමයෙක් වූ ඔහුට වඩා අවුරුදු 14 ක් වයසින් වැඩි වූ විල්හෙල්ම් ලිබ්නෙක්ට් සමඟ සමීප සහයෝගයෙන්, ඕගස්ට් බෙබෙල් ජර්මානු කම්කරු පන්තිය පුබුදුවා හලේය. එසේකුදු වුවත්, 1914 ව්‍යසනය වැළැක්වීමට ඔහුට නොහැකි විය.

බෙබෙල් විසින් අඩ සියවසකට අධික කාලයක් වෙහෙස නොබලා සිදු කරන ලද දැවැන්ත හා සාර්ථක දේශපාලන හා සංස්කෘතික අධ්‍යාපනික කටයුතුවල තීරණාත්මක පාඩම් රාශියක් අඩංගු වේ. ඒවායින් දෙකක් මෙහිදී සාකච්ඡා කෙරේ.

පළමුව, මාක්ස්වාදයේ ධජය යටතේ විප්ලවවාදී සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් විසින් සාක්ෂාත් කරගත් දියුණුව, වැඩ කරන පුළුල් මහජනතාව ස්වාධීන දේශපාලන භූමිකාවක් ඉටු කිරීමට අසමත් බවටත්, "පහළින් එන ව්‍යාපාරයක්" අනිවාර්යයෙන්ම දක්ෂිණාංශික දිශාවකට වර්ධනය වන බවටත් පැතිර පවතින සංකල්ප ප්‍රතික්ෂේප කරයි. සුලු ධනේශ්වර බුද්ධිමතුන්ගේ නියෝජිතයින්, සියල්ලටත් වඩා ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය (හෝර්කයිමර්, ඇඩෝර්නෝ, මාර්කූස්, හබර්මාස් සහ වෙනත් අය - Horkheimer, Adorno, Marcuse, Habermas and others) සමඟ සම්බන්ධ වූවන්, 1933 ව්‍යසනයෙන් වඩාත්ම අශුභවාදී පාඩම් උකහා ගත්හ. හිට්ලර්ගේ ජයග්‍රහණයට කම්කරු පන්තිය වගකිව යුතු බව ඔවුහු අවධාරනය කළහ.

ඇත්ත වශයෙන්ම, හිට්ලර්ගේ කේන්ද්‍රීය කර්තව්‍යය වූයේ සංවිධානාත්මක කම්කරු ව්‍යාපාරය සහ එය සටන් කළ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සහ සමාජ ජයග්‍රහණ විනාශ කිරීමයි. 1933 මාර්තු 24 වන දින සියලුම ධනේශ්වර පක්ෂ හිට්ලර්ට හදිසි බලතල ප්‍රදානය කරන නීති සම්පාදනයට පක්ෂව තීරණාත්මකව ඡන්දය දුන්නේ මේ නිසාය.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ මාක්ස්වාදී නායකත්වය යටතේ කම්කරු පන්තිය විසින් ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සහ සමාජ ජයග්‍රහණ සඳහා සටන් කළ බව ඓතිහාසික සත්‍යයකි. මේවාට සර්වජන ඡන්ද අයිතිය, නිදහස් පොදු අධ්‍යාපනය, පිරිමින්ගේ සහ කාන්තාවන්ගේ සමානාත්මතාවය, පැය අටේ වැඩ කරන දිනය සහ SPD හි වර්ධනය වන බලපෑම සහ නැගීම පිළිබඳ බියෙන් බිස්මාර්ක් විසින් හඳුන්වා දුන් අනිවාර්ය සමාජ රක්ෂණ වැඩසටහන් ඇතුළත් වේ.

බෙබෙල්ගේ එස්පීඩීය කම්කරු පන්තිය තුළ ගැබ් වූ දැවැන්ත ශක්තිය නිර්මාණාත්මක බලය සහ සංස්කෘතික විභවය හෙළිදරව් කළේය.

බෙබෙල් යටතේ එස්පීඩී පක්ෂයේ නැගීම, වෘත්තීය සමිති කම්කරු පන්තියේ ප්‍රධාන සංවිධාන බවට කරන ප්‍රකාශය ද විකණ්ඩනය කරයි. යථාර්ථය නම් කම්කරු පන්තියේ නැගීම ආරම්භ

වූයේ තමන්ගේම විප්ලවවාදී සමාජවාදී පක්ෂයක් සහිත දේශපාලන ව්‍යාපාරයක් ලෙස ය. වෘත්තීය සමිති පසුව මතුවී ඉක්මනින් සමාජවාදී ව්‍යාපාරයේ දක්ෂිණාංශය පිහිටුවා ගත්හ. ඔවුන් විප්ලවයේ දැඩි විරුද්ධවාදීන් වූ අතර, රෝසා ලක්සම්බර්ග්ට පහර දුන් අතර බෙබෙල්ගේ මරණයට පෙර වසරවලදී ඔහුව බ්ලැක්මේල් කළහ.

බෙබෙල්මත් කම්කරුවෙක් විය. ඔහු 1840 පෙබරවාරි මාසයේදී කොලෝන් හි දුප්පත් කනිෂ්ඨ ප්‍රෂියානු හමුදා නිලධාරියෙකුගේ පුතෙකු ලෙස උපත ලැබූ අතර, ඔහු වයස අවුරුදු අටේදී යුරෝපීය විප්ලවයන් අත්විඳින ලද්දේය. ඔහුගේ ස්වයං චරිතාපදානයේ දී, එම කාලය තුළදී ඔහු තම පළමු සංයුක්ත දේශපාලන පාඩම ලබා ගත් ආකාරය විස්තර කළේය. 1848-49 විප්ලවවාදී වසරවලදී, රයින්ලන්ඩ් කලාපයේ ජනරජවාදය (Republicanism) සඳහා පුළුල් සහයෝගයක් තිබුණි. [එක් අවස්ථාවක] තරුණ බෙබෙල් තවත් පන්තියේ මිතුරෙකු සමඟ පාසලේදී රාජාණ්ඩුවට පක්ෂව කතා කළ විට, ඔවුන්ට හොඳ ගුටි සංග්‍රහයක් ලැබුනි. බෙබෙල් පසුව හාස්‍යජනක ලෙස සඳහන් කළ පරිදි එය පළමු "පන්ති ගුටිකෑම" විය.

ආධුනික ශිල්පියෙකු ලෙස ගත කළ කාලය තුළ ඔහු "කාර්මික අධ්‍යාපන සංගමයට" සම්බන්ධ වී දැඩි ස්වයං අධ්‍යාපනයක් ලබා ගත්තේය. 1863 දී ලයිප්සිග් හි ෆර්ඩිනන්ඩ් ලැසාල් (Ferdinand Lassalle) සාමාන්‍ය ජර්මානු කම්කරු සංගමය (General German Workers Association-ADAF) ආරම්භ කළ විට, බෙබෙල් තම දුරස්ථභාවය පවත්වා ගත්තේය. ලැසාල්ගේ විකේන්ද්‍රීය (eccentric) පෙනුම සහ ඒකාධිපති හැසිරීම නිසා ඔහු විකර්ෂනය වූ අතර ප්‍රතිගාමී ප්‍රෂියානු අගමැති ඔටෝ වොන් බිස්මාර්ක් (Otto von Bismarck) වෙත ඔහුගේ ප්‍රවේශයන්ට දැඩි ලෙස විරුද්ධ විය.

ලසාල් සමඟ ගැටුමේදී, බෙබෙල් මාක්ස් සහ එංගල්ස්ගේ ලේඛන අධ්‍යයනය කළ අතර විල්හෙල්ම් ලිබ්නෙක්ට් සමග ඔහුගේ මිත්‍රත්වය ආරම්භ වූයේ ය. 1867 සරත් ඍතුවේ දී ඔහු ජර්මානු කම්කරු සංගම් සමිතියේ (Union of German Workers' Associations) සභාපති ලෙස තේරී පත් වූ අතර, මාක්ස් විසින් සකස් කරන ලද ජාත්‍යන්තර කම්කරු සංගමයේ (International Workers Association) විධිවිදාන ඔහු ක්‍රියාත්මක කළේය. ඒවා ප්‍රකාශ කළේ, "කම්කරු පන්තියේ විමුක්තිය සඳහා කම්කරු පන්තිය තමන් විසින්ම සටන් කළ යුතුය" යනුවෙනි. මෙම පදනම මත, බෙබෙල් එතෙක් කම්කරු සංගම්වලට දැඩි ලෙස බලපෑම් කළ ධනේශ්වර ලිබරල්වාදයට එරෙහිව පැහැදිලි රේඛාවක් ඇඳීය.

වසර දෙකකට පසු, බෙබෙල් සහ ලිබ්නෙක්ට් 1869 අගෝස්තු මාසයේදී අයිසෙනාච් (Eisenach) හිදී සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය (Social Democratic Workers Party-SDAP) ආරම්භ කළහ. බෙබෙල් විසින් රචිත පක්ෂ වැඩසටහන මාක්ස්වාදය දෙසට නැඹුරු වූ අතර, වෙනත් දේ අතර ධනේශ්වර නිෂ්පාදන ක්‍රමය අහෝසි කිරීම සඳහා කැඳවුම් කළේය. කෙසේ වෙතත්, "නිදහස් ජනතා රාජ්‍යයක් ස්ථාපිත කිරීම" සඳහා වූ ඉල්ලීම වැනි ලිබරල්වාදයේ බලපෑම තවමත් වැඩසටහන තුළ දක්නට ලැබේ.

ඊළඟ ගිම්හානයේදී, ඡන්දයට දින දෙකකට පෙර යුද්ධය ප්‍රකාශ කළ ප්‍රංශයට එරෙහිව සටන් කිරීම සඳහා ප්‍රෂියානු යුද ණය සම්බන්ධයෙන් උතුරු ජර්මානු රීච්ස්ටැග් හි පැවති ඡන්ද විමසීමකදී, ලිබ්නෙක්ට් සමඟ එක්ව ඡන්දය දීමෙන් වැළකී සිටීමෙන් පසු බෙබෙල් වෛරයේ රැල්ලකට මුහුණ දුන්නේය. 1871 මැයි මාසයේදී බෙබෙල් පැහැදිලිවම පැරිස් කොමියුනය



බෙබෙල්, විල්හෙල්ම් ලිබ්නෙක්ට්

ආරක්ෂා කළ විට කෝපය උත්සන්න විය.

පසුව බෙබෙල් සහ ලිබ්නෙක්ට් යන දෙදෙනාම රාජද්‍රෝහී ක්‍රියාවකට සූදානම් වීම සම්බන්ධයෙන් වරදකරුවන් වූ නමුත්, බොහෝ කම්කරුවන් විසින් ඔවුන්ගේ ස්ථාවරය සඳහා ඔවුන්ව ප්‍රශංසාවට ලක් කෙරුණි. 1872 ජූලි මාසයේදී හියුබර්ටස්බර්ග් (Hubertusburg) බන්ධනාගාරයේ

ඔහුගේ දඬුවම ආරම්භ කිරීමට බෙබෙල් දුම්රියෙන් එළියට ආ විට, දුම්රිය සේවකයින් රාජ්‍ය නායකයෙකුට ගරු කරන්නාක් මෙන් ඔහුට ආචාර කළහ.

බෙබෙල් තම සිරගත කාලය ඔහුගේ "කාන්තාව සහ සමාජවාදය" (Women and Socialism) නම් පොත ලිවීමට යොදා ගනිද්දී , ලසාල් සහ එස්ඩීඒපී අනුගාමිකයින් එකිනෙකාට සමීප විය. බෙබෙල් සිරෙන් නිදහස් වී මාසයකට පසු, එක්සත් කිරීමේ සම්මේලනය 1875 මැයි මාසයේදී ගෝතා හිදී පැවැත්විණි. මෙම සම්මේලනය සියල්ලටම වඩා මාක්ස් විසින් ගෝතා වැඩසටහනට (Gotha programme) කරන ලද තියුණු විවේචන සඳහා ප්‍රසිද්ධය.

එක්සත් වීමෙන් පසු, ජර්මනියේ සමාජවාදී කම්කරු පක්ෂය (SAPD) වේගයෙන් වර්ධනය වූ අතර, වසර 15 කට පසු එහි නම ජර්මනියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (SPD) ලෙස වෙනස් කළේය. එක්සත් වීමෙන් වසර තුනකට පසුවෙද්දීම, පක්ෂයට ප්‍රාදේශීය පුවත්පත් 47 ක් තිබූ අතර, එහි මධ්‍යම ආයතනය ලෙස Vorwärts (Forwards) පැවතිණි. එය රයික්ස්ටාග් (Reichstag) මැතිවරණවලදී සියයට 10 ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත් අතර, එය එක්සත් වීමට පෙර සංවිධාන දෙකෙහිම ඒකාබද්ධ එකතුවට සාපේක්ෂව සියයට 40 ක වැඩිවීමක් විය. බිස්මාර්ක් ඔහුගේ ප්‍රති-සමාජවාදී නීතියෙන් ප්‍රතිචාර දැක්වීය. පක්ෂයේ සියලුම සංවිධාන සහ පුවත්පත් තහනම් කරන ලදී, නමුත් පාර්ලිමේන්තු කන්ඩායම සහ එහි නියෝජිතයින්ගේ වැඩ නීති විරෝධී කිරීමට බිස්මාර්ක් දැරූ උත්සාහය අසාර්ථක විය.

නීති විරෝධීව සිටි වසරවලදී බෙබෙල් දේශපාලන කීර්තිය සහ න්‍යායික පැහැදිලිකම ලබා ගත්තේය. තියුණු කන්ඩායම් සටන් ඇති විය. මධ්‍යස්ථවාදීන් සහ රැඩිකල්වාදීන් පක්ෂයේ ප්‍රමුඛ ස්ථානය සඳහා අරගල කළහ. අවසානයේ රැඩිකල්වාදීන් ජයග්‍රහණය කළ අතර, එය සියල්ලටම වඩා බෙබෙල්ගේ උසස් උපායික හැකියාවන් සහ කීර්තිය නිසා විය. මෙම ජයග්‍රහණයට ප්‍රධාන හේතුව වූයේ බෙබෙල්ගේ කන්ඩායම අනන්‍ය වූ මාක්ස්වාදයේ වර්ධනය වෙමින් පැවති අධිකාරය යි. එංගල්ස්ගේ ඩූරිං විරෝධය (*Anti-Dühring*) ප්‍රකාශයට පත් කිරීම කම්කරු ව්‍යාපාරය තුළ සමාජවාදයේ අධිකාරී හඬ බවට මාක්ස්වාදය පත් කර තිබුණි.

බෙබෙල් සහ ඔහුගේ ආධාරකරුවන් මාක්ස්වාදී මූලධර්ම සහ විප්ලවවාදී ඉදිරිදර්ශනයක් පැහැදිලිව ඉදිරිපත් කරන තරමටම, කර්මාන්තශාලා තුළ එස්පීඩීයේ පැවැත්ම වැඩි වැඩියෙන් වර්ධනය විය. 1889 මහා වැඩ වර්ජන ව්‍යාපාරයේදී මෙය පැහැදිලිව දිස් විය. රුහර්හි පතල්වල වැඩ නතර කිරීම් ආරම්භ වූ අතර, පසුව ඉක්මනින් ආකන්, සාර්ලන්ඩ්, සැක්සනි සහ සයිලීසියාව (Ruhr, Aachen, the Saarland, Saxony and Silesia) දක්වා ව්‍යාප්ත විය. රුහර්හි පතල් කම්කරුවන් 97,000 ක් (ශ්‍රම බලකායෙන් සියයට 86 ක්) වැඩ වර්ජනයට එක් විය. සන්නද්ධ ගැටුම් ඇති වූ අතර සොල්දාදුවන් මැදිහත් වූ නමුත් වැඩ වර්ජන දිගටම වර්ධනය විය. 1890 අප්‍රේල් වන විට, වැඩ වර්ජන සංඛ්‍යාව 715 දක්වා ළඟා වූ අතර, ගොඩනැගිලි, රෙදිපිළි සහ ලෝහ කර්මාන්තවල මුළු කම්කරුවන් 289,000 ක් සහභාගී වූහ.

එම වසරේම රයික්ස්ටාග් මැතිවරණයේදී, එස්පීඩී පක්ෂය තම ඡන්ද මුළු ප්‍රමාණය සියයට 20 දක්වා දෙගුණ කළේය. සති කිහිපයකට පසු බිස්මාර්ක් ඉල්ලා අස් වූ අතර, එම වසරේ ඔක්තෝබර් මාසයේදී සමාජවාදී විරෝධී නීති අවලංගු කරන ලදී.

නීත්‍යානුකූල පක්ෂයක් ලෙස එස්පීඩී පක්ෂය ඊටත් වඩා වේගයෙන් වර්ධනය විය. 1890 දී සමාජවාද විරෝධී නීති අවසානයේ සිට 1914 දී පළමු ලෝක යුද්ධය පුපුරා යාම දක්වා වූ ශත වර්ෂ කාලක කාල පරිච්ඡේදයක තුළ එය ජර්මනියේ විශාලතම පක්ෂය බවට පත්විය. නමුත් පක්ෂයට ලැබුණු ඡන්ද සංඛ්‍යාව කම්කරු ව්‍යාපාරය තුළ එහි බලපෑමේ පුළුල් බව හා ගැඹුර සම්පූර්ණයෙන්ම පැහැදිලි නොකරයි.

ඒ කාලයේ දී, එස්පීඩී පක්ෂය ඓතිහාසික වශයෙන් සුවිශේෂ සංසිද්ධියක් විය: මන්දයත්, එය පළමු සැබෑ මහජන කම්කරු පන්ති පක්ෂය විය. එය සමාජයේ සියලු ධනය නිර්මාණය කළ සහ පන්ති රහිත සමාජයක් ගොඩනැගීමට සමත් වන පන්තියක විචිත්‍ර අපේක්ෂාවන්, උද්යෝගය සහ නිර්මාණශීලීත්වය අවදි කළේය.

20 වන සියවස උදා වෙද්දී, කම්කරු පන්ති ජීවිතයේ සියලු අංශ එස්පීඩී ය විසින් සංවිධානය කරන ලදී. පහත සංඛ්‍යාලේඛන මගින් එස්පීඩී හි වර්ධනය හා බැඳුණු කම්කරු පන්තියේ සංස්කෘතික සංවර්ධනය නිරූපණය කෙරේ. 1900 සහ 1914 අතර බෙබෙල්ගේ පක්ෂය පුස්තකාල 1,100 ක් ආරම්භ කිරීමට සම්බන්ධ විය. මෙම පුස්තකාලවල වෙළුම් 80,000 කට අධික එකතුවක් තිබුණි. 1914 වන විට පක්ෂයේ වැටුප් ලේඛනයේ පුස්තකාලයාධිපතිවරුන් 365 ක් සිටියහ.

කෙසේ වෙතත්, එස්පීඩී හි වේගවත් නැගීම සහ දේශපාලන බලපෑම වැඩිවීම භයානක ප්‍රතිවිපාක ගෙන දුන්නේය. එය 1895 අර්ෆර්ට් වැඩසටහනේ (Erfurt Programme) දක්වා තිබූ එහි විප්ලවවාදී ඉදිරිදර්ශනය සහ පක්ෂයේ එදිනෙදා කටයුතුවල නොවැළැක්විය හැකි ප්‍රතිසංස්කරණවාදී ස්වභාවය අතර ගැටුම තීව්‍ර කළේය.

පක්ෂයේ ප්‍රමුඛ න්‍යායාචාර්යවරයා ලෙස මතු වූ කාල් කෞට්ස්කි, "උපරිම සහ අවම වැඩසටහන් (maximum and minimum programmes)" යන ඔහුගේ සංකල්පය සමඟින් විප්ලවවාදී ඉලක්ක සහ පක්ෂයේ ප්‍රතිසංස්කරණවාදී ක්‍රියාකාරකම් අතර පරතරය පියවීමට උත්සාහ කළේය. පළමුවැන්න එස්පීඩීයේ ඓතිහාසික ඉලක්ක නියෝජනය කළ අතර දෙවැන්නෙහි පක්ෂයේ ප්‍රායෝගික ඉල්ලීම් අඩංගු විය. ඔහු තවමත් විප්ලවවාදී වැඩසටහන ආරක්ෂා කළ නමුත්, පක්ෂයේ භාවිතය (practice) ඒ වන විටත් "කළ හැකි දෙය (possibilism)" ලෙස හැඳින්වූ රාමුවට අවස්ථාවාදී අනුවර්තනයකින් සංලක්ෂිත විය.

පක්ෂය තුළ වර්ධනය වන අවස්ථාවාදය සහ වෘත්තීය සමිතිවල වැඩිවන බලපෑම සමඟ ඇති වූ අනතුර බෙබෙල් අවතක්සේරු කළේය. 1890 ගණන්වල මැද භාගය වන තෙක්, වෘත්තීය සමිතිවල වර්ධනය පක්ෂයට වඩා පසුගාමී වූ අතර එය වෘත්තීය සමිතිවලට දේශපාලන නායකත්වය සහ ද්‍රව්‍යමය සහයෝගය ලබා දුන්නේය. නමුත් 1895 දී ආරම්භ වූ සහ පළමුවන ලෝක යුද්ධය පුපුරා යන තෙක්ම පැවති ප්‍රධාන ආර්ථික උත්පාතයක් වෘත්තීය සමිතිවල දැවැන්ත ව්‍යාප්තියක් දිරිමත් කළ අතර, ඔවුන් සහ පක්ෂය අතර සම්බන්ධතාවය මූලික වශයෙන් වෙනස් කළේය. වෘත්තීය සමිති සැලකිය යුතු මූල්‍ය සම්පත් ලබා ගත් විට, ඔවුන් සමාජවාදී ව්‍යාපාරයට වඩ වඩාත් සතුරු විය.

මෙයට හේතුව ධනවාදය යටතේ වෘත්තීය සමිතිවල භූමිකාවයි. ඔවුන් කම්කරුවන් නියෝජනය කරන්නේ ඉතා නිශ්චිත ආර්ථික භූමිකාවක, එනම් ඔවුන්ගේ ශ්‍රම ශක්තිය (labour power) විකිණීම තුලයි. ධනේශ්වර ආර්ථික සබඳතා ඔවුන්ගේ පැවැත්මේ පදනම වන බැවින්, වෘත්තීය සමිතිවල මූලික ප්‍රවණතාවය වන්නේ පන්ති අරගලය මර්දනය කිරීම සහ සමාජවාදී ව්‍යාපාරයට එරෙහි වීමයි. රෝසා ලක්සම්බර්ග්ට බොහෝ වෘත්තීය සමිති සම්මේලනවලදී කතා කිරීම තහනම් කරන ලද්දේ මේ හේතුවෙනි.

වෘත්තීය සමිතිවල වර්ධනයට සමගාමීව අවස්ථාවාදයේ න්‍යායාචාර්යවරයා ලෙස එඩ්වඩ් බර්න්ස්ටයින් මතු විය. ජාතික රාමුව තුළ කම්කරුවන්ගේ ආදායම් ප්‍රතිශතයේ නිරන්තර වැඩිවීමක් ඒවාට සහතික කළ හැකි බව වෘත්තීය සමිති ඔප්පු කර ඇති බව ඔහු කියා සිටියේය. එබැවින්, පෙනෙන ආකාරයට කම්කරු පන්තිය දරිද්‍රතාවයට ඇද වැටීම පිළිබඳ මාක්ස්ගේ න්‍යාය ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත. කම්කරු පන්තියේ දිගුකාලීන අවශ්‍යතා සාක්ෂාත් කරගත හැකිවනු ඇත්තේ විප්ලවවාදී ඉදිරිදර්ශනයකින් නොව, වෘත්තීය සමිති විසින් සාක්ෂාත් කර ගන්නා ලද ප්‍රතිසංස්කරණ නිරන්තරයෙන් සමුච්චය කිරීමෙන් යන ස්ථාවරය බර්න්ස්ටයින් ආරක්ෂා කළේය.

බෙබෙල් පක්ෂයේ විප්ලවවාදී සහ අවස්ථාවාදී අංශ අතර වැඩෙන බෙදීම් සමනය කිරීමට සහ බෙදීමක් වැළැක්වීමට උත්සාහ කළේය. 1905 රුසියානු විප්ලවයෙන් පසුව, 1906 දී මැන්හයිම් හි පැවති පක්ෂ සම්මේලනයේ මහජන වැඩ වර්ජනය (mass strike) පිළිබඳ විවාදයෙන් පසු පක්ෂයෙන් වෙන් වන බවට විවෘතව තර්ජනය කරමින් වෘත්තීය සමිති බෙබෙල්ව හිර කිරීමට උත්සාහ කළේය. බෙබෙල් වෘත්තීය සමිති සමඟ රහසිගත ගිවිසුමකට එකඟ වූ අතර, එය ඊලඟ වසරවලදී සමිතිවල සහ පක්ෂය තුළ අවස්ථාවාදී ප්‍රවණතාවයේ බලපෑම ශක්තිමත් කළේය.

1914 දී එස්පීඩී නායකත්වය යුද වියදම් සඳහා ඡන්දය දුන් විට බිහිසුණු ප්‍රතිවිපාක පැහැදිලි විය. වසර හතරකට පසු, නොවැම්බර් විප්ලවය ලේ වැකි ලෙස මර්දනය කිරීමට සහ රෝසා ලක්සම්බර්ග් සහ කාල් ලිබ්නෙක්ට් ඝාතනය සංවිධානය කිරීමට ඔවුන් ෆ්‍රයිකෝප්ස් (Freikorps) හමුදා එක්රැස් කළහ.

ඔහුගේ ජීවිතයේ අවසාන වසරවලදී, අධිරාජ්‍යවාදී යුගයට මාරුවීමේදී මතුවූ විප්ලවවාදී අභියෝගවලට මුහුණ දීමට තරම් තත්වයක ඔගස්ට් බෙබෙල් තවදුරටත් සිටියේ නැත.

එස්පීඩීයේ බේදවාචකය ලියොන් ට්‍රොට්ස්කි තරම් සංක්ෂිප්තව හා දීප්තිමත් ලෙස කිසිවෙකු ගෙනහැර දැක්වූයේ නැත: "ජර්මානු නිර්ධන පංතියේ සංවිධානය අඛණ්ඩව වර්ධනය විය, අරමුදල් වැඩි විය, පුවත්පත්, නියෝජිතයින් සහ නාගරික මන්ත්‍රීවරුන් සංඛ්‍යාව අඛණ්ඩව ගුණ කරන ලදී. ඒ සමඟම ප්‍රතිගාමීත්වය එහි සියලුම ස්ථාවර සඳහා ස්ථිරව රඳා පැවතුනි. ජර්මානු සමාජ ජීවිතයේ ධ්‍රැවීය බලවේග දෙක අතර ගැටුමේ නොවැළැක්විය හැකි බව ගලා ආවේ මෙතැනිනි. නමුත් මෙම ගැටුම දිගු කලක් තිස්සේ ඇති නොවූ අතර, සංවිධානයේ බලවේග සහ සම්පත් කෙතරම් ස්වයංක්‍රීයව වර්ධනය වුවාද යත්, එවැනි තත්වයකට හුරුවීමට මුළු පරම්පරාවකටම කාලය තිබුණි. එමෙන්ම, සෑම කෙනෙකුම තීරණාත්මක ගැටුමේ නොවැළැක්විය හැකි බව ගැන ලිව්වත්, කතා කළත් හෝ කියෙව්වත්-එකම මාර්ගයක් ඔස්සේ එකිනෙක දෙසට යන දුම්රිය දෙකක් අතර ගැටුමේ නොවැළැක්විය හැකි බව මෙන් – අවසානයේ ඔවුන් තුළම මෙම අනිවාර්යතාව සංවේදනය කිරීමට ඔවුනට නොහැකි විය. වයස්ගත බෙබෙල් අනෙක් බොහෝ දෙනෙකුගෙන් කැපී පෙනුනේ සිදුවීම් ඒවායේ පරිසමාප්තියට මාරාන්තික ලෙස හේතු වන බවට වූ නිශ්චිත හැඟීමකින් ඔහු තම අවසාන කාලයේ ජීවත් වූ බැවිනි. " [ඉහත කෘතිය]

# බහුචිතවාදියා: තාරුණ්‍යයේ සමාජ අර්බුදය අශුභවාදයට සහ විප්‍රරූපණයකට සිඳලීමක්




සංජය ජයසේකර විසිනි.

මෙය 2025 ජුනි 04 දින "Bahuchithawadiya: The Social Crisis of Youth reduced to Pessimism and Caricature" නමින් theSocialist.lk වෙබ් අඩවියේ පලවූ ලිපියේ සිංහල පරිවර්තනය යි.

මාලක දේවප්‍රියගේ බහුචිතවාදියා චිත්‍රපටය පශ්චාත් සිවිල් යුධ නාගරික ශ්‍රී ලංකාවේ අතරමංව සිටින තාරුණ්‍යයේ ප්‍රතිමූර්තියක් ඉදිරිපත් කිරීමට උත්සාහ කරන අභිලාෂකාමී නමුත් අවසන් විග්‍රහයේදී මංමුළාවූ කෘතියකි. චරිත අධ්‍යයනයක ස්වරූපයක් ගන්නා මෙම චිත්‍රපටය අධ්‍යක්ෂවරයාගේම හැඳින්වීමට අනුව, "රැකියා සුරක්ෂිතතාව නොමැතිකම නිසා ජීවත්වීමට පහසු මාර්ග සොයන, මේ රටින් පැනයාමේ සිහිනයේ ගිලී සිටින, තම පැරණි සිහිනය සැබෑ කර ගැනීමට සමාජ මාධ්‍ය, ස්මාර්ට්ෆෝන් සහ අයිෆෝන් භාවිතා කරමින් සහ සියලු මානව සම්බන්ධතා ඔවුන්ගේ ගොදුරු බවට පත් කර ගන්නා සමකාලීන තරුණ පරපුරේ පිළිබිඹුවක් ඉදිරිපත් කරයි."

චිත්‍රපටය එහි පර්යේෂණාත්මක තානය සහ දිළිඳු, රැකියා විරහිත හෝ අවිනිශ්චිත රැකියාවල නියුක්ත සහ අවිදිමත් ශ්‍රම වෙළඳපොලේ සූරා කැවෙන, කොළඹ තරුණ තරුණියන් ගේ පරත්වාරෝපණය නිරූපණය කිරීම මගින් අවධානය දිනා ගෙන ඇත. කෙසේ වෙතත්, එහි සිනමා රූපයට යටින්, චිත්‍රපටය සමාජ පරිහානිය පිළිබඳ අඳුරු, මතුපිටින් කෙරෙන නිරූපනයක් සහ කම්කරු පන්තියේ සහ රැකියා විරහිත තාරුන්‍යය කෙරෙහි කලකිරීම් සහගත සහ අවසානයේදී ප්‍රතිගාමී අධිචෝදනාවක් – ඔවුන් ධනවාදයේ ගොදුරු ලෙස නොව, ඔවුන්ගේම සදාචාර පරිහානියේ කාරකයන් ලෙස – ඉදිරිපත් කරයි.

ප්‍රධාන චරිතය වන සසිත (කලණ ගුණසේකර) රටේ කාර්මික අගනුවර වන කොළඹ බෙදාහැරීමේ සේවාවේ නියුතු කම්කරුවෙකි. ඔහු අවිනිශ්චිත තත්ත්වයන් යටතේ සේවයේ යොදවා ඇත්තේ මසුරු ස්වාමියෙකු විසිනි. ආර්ථික හෝ සමාජීය ඉදිරි ගමනක් පිලිබද කිසිදු අපේක්ෂාවක් නොමැතිව සසිත තම අවධානය යොමු කරන්නේ, යුරෝපීය රටකට වීසා ලබා ගැනීමේ හෝ යම් මූල්‍යමය ප්‍රතිලාභයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ස්ත්‍රීන්–විවාහක, අවිවාහක, වැඩිමහල්, බාල–ඔන්ලයින් මඟින් පොළඹවා ගැනීම සඳහාය. ඔහුගේ දෙපිටිකාට්ටුකම සහ මෙම කාන්තාවන් සූරාකෑම නිරූපණය කරනු ලබන්නේ ම්ලේච්ඡ ආර්ථික ක්‍රමයට ප්‍රතිචාර වශයෙන් අකමැත්තෙන් සහ තාවකාලිකව කරන කොල්ලකාරී ක්‍රියා ලෙස නොව ඔහුගේ චරිතයේ සහජ සහ ස්ථිර ලක්ෂණ ලෙස ය. ඔහු තුළින් මතුවන්නේ ස්ථරමය මනුෂ්‍යයෙකු නොව නරුමත්වයේ සහ අවිනිශ්චිතතාවයේ ගිලි වැදගැම්මක් නැති පුද්ගලයෙකි. චිත්‍රපටයේ බරපතලම අසාර්ථක වීමක් වන්නේ සසිතගේ හැසිරීම් නිරූපණය, සමාජ බලවේග සහ ඔහු ජීවත් වන ද්‍රව්‍යමය තත්වයන් හරහා පැහැදිලි කිරීමට කිසිදු බැරෑරුම් උත්සාහයක් නොගැනීමයි.

දේවප්‍රිය සමාජ ජීවිතයේ ඇතැම් මතුපිට ලක්ෂණ ග්‍රහණය කර ඇත. චිත්‍රපටය විෂකුරු හැසිරීම් මාලාවක් ඉදිරිපත් කරයි–පරදාර සේවනය, පාවාදීම, වංචාව, සූරාකෑම, බලාපොරොත්තු විරහිතභාවය–එහෙත් ඒ කිසිවකට ඒවායේ යටින් පවතින ප්‍රතිවිරෝධතා හෙළි කිරීම සදහා තිරසාර අවධානයක් දිම හෝ ගැඹුරින් විමසා බැලීමක් කර නැත. මේ නිසා නරඹන්නාට ඉතිරි වන්නේ ඒවා මතු කරන සමාජ යථාර්ථය පිළිබඳ අවබෝධයකට වඩා රෝග ලක්ෂණ එකතුවකි. මෙය හුදු සෞන්දර්යාත්මක හෝ කලාත්මක අඩුපාඩුවක් නොව, ගැඹුරු දෘෂ්ඨිවාදීමය එකකි. කලාකරුවෙකු ජීවිතය නිකම්ම ප්‍රතිනිර්මාණය නොකරයි; ඔහු ඡායාරූප ශිල්පියෙක් නොවේ. සත්‍යය සොයා මතුකර ගැනීමේ වගකීම ඔහු දරයි. සසිතගේ පුද්ගලික දූෂිතභාවය, එය නිපදවන සහ ඊට පටහැනිව පවතින සැබෑ ලෝකයෙන්

හුදකලා කිරීමෙන්, බහුචිතවාදියා යථාර්ථවාදයට හිමිකම් කීවද, අවසානයේ ගැඹුරු මග හැරීම සහ වංක බව පෙන්නුම් කරයි.

“සමකාලීන යෞවනය” නියෝජනය කරන චරිතයක් අවිනිශ්චිත, උපාමාරු යොදාගන්නා සහ නිර්සදාචාරාත්මක බැවි පෙන්වීම ප්‍රමානවත් නොවේ. යමෙකු ඇසිය යුතු වන්නේ: ඒ ඇයි? මෙම විෂ සහිත චරිතය හැඩගස්වා ඇත්තේ කුමකින්ද? ඔහු මත ක්‍රියා කරන බලවේග මොනවාද? ඔහුගේ ජීවිතයට වගකිව යුත්තේ කවුද? ඔහුගේ හැසිරීම නොවැළැක්විය හැකිද? දේවප්‍රිය මේ ප්‍රශ්න ගැන උනන්දුවක් නැති බව පෙනේ. එහි ප්‍රතිඵලය වන්නේ චරිත ඝාතනය අද්දරට යන සිනමාපටයකි. සසිත ධනේශ්වර ක්‍රමයේ ගොදුරක් ලෙස හෝ එහි අසාධාරණයට එරෙහි වීමේ යන්තම් හෝ ප්‍රතිරෝධයක් දක්වන අයෙකු ලෙසින් නිරූපණය නොවේ. ඒ වෙනුවට, ඔහු පෙනී සිටින්නේ එහි දූෂිත බවින් ප්‍රයෝජන ගැනීමට උත්සාහ කරන අතර–ඊට පරස්පර විරෝධී ලෙස–එහි ප්‍රතිවිපාකවලින් ගැලවී ගැනීමට උත්සාහ කරන එහි කැමැති සහකරුවකු ලෙස ය. අවසාන විග්‍රහයේ දී ඔහුව පෙන්වා දෙනු ලැබෙන්නේ විෂ සහිත සමාජ ක්‍රමයකින් හැඩගැසුණු අයෙකු ලෙස නොව එහි නිර්මාණ කරුවෙකු ලෙස ය. අප දන්නා “තරුණයා” ගේ පැවැත්ම අහෝසි වී ඇත!

අවිනිශ්චිතතාවය, වංකකම, විශ්වාසය හීන වීම අඩංගු කරගත් සමකාලීන තාරුණ්‍යයේ අර්බුදය පවතින්නේ ඔවුන්ගේම චරිතය තුළ බව නිගමනය කිරීමට චිත්‍රපටය නරඹන්නාට ආරාධනා කරයි. මෙය, දරිද්‍රතාවයෙන් පෙළෙන, රැකියා විරහිත හා නොසන්සුන් තරුණයින් දැක බියෙන් පසුබාන මධ්‍යම පන්තිය සහ එහි බුද්ධිජීවී ප්‍රකාශකයින් විසින් හිණිය නොහැකි වාර ගණනක් පුනරුච්චාරණය කරන ලද පැරණි අවලාදයකි. මෑත ඉතිහාසය තුළ තරුණයින්ගේ වඩාත් කැපී පෙනෙන මහජන නැගිටීමක් 2022 දී දුටු රටක මෙම මතය සිනමාත්මක ප්‍රකාශනයක් අත්කර ගැනීම, ප්‍රගාඪ ඇඟවුම්කාරකයක් වන්නා සේම අපකීර්තිමත්ද වේ. අවසානයේදී, තරුණයින් තම පන්ති සතුරා සොයා ගැනීමක් සිදු වන්නේ නැත.

චිත්‍රපටයේ අවසාන දර්ශනයේ දැක්වෙන්නේ සසිත තම පෙර රැවටිලිකාරම් අතටම හසු වූ පසුව පවා කිසිදු පසුතැවිල්ලකින් තොරව




අන්තර්ජාලය හරහා කාන්තාවන් පොළඹවා ගැනීමේ ක්‍රියාව යාන්ත්‍රිකව නැවත ආරම්භ කරන බවයි. තරුණ හැසිරීම් හැඩගස්වන සැබෑ සමාජ සහ මනෝවිද්‍යාත්මක ගතිකයන් ගවේෂණය කිරීමට චිත්‍රපට අධ්‍යක්ෂක අඩු සැලකිල්ලක් දක්වන බවටත්, පීඩිත තාරුණ්‍යය නෛසර්ගිකවම ආත්මාර්ථකාමී, විශ්වාසය තැබිය නොහැකි, පාඩම් ඉගෙන නොගන්නා සහ නොමග ගිය ලෙස සලකන මධ්‍යම පන්තික දෘෂ්ටිවාදයක් තහවුරු කිරීමට ඔහුට වැඩි අභිප්‍රායක් ඇති බවටත් මෙය තීරණාත්මක සාක්ෂියක් ලෙස ක්‍රියා කරයි.

චිත්‍රපටයේ කේන්ද්‍රීය සංකල්පය වන “බහුචිතවාදියා” සදාචාරාත්මක සහ මනෝවිද්‍යාත්මක සංශයවාදයේ ස්ථිර සහ සහජ තත්වයක් යෝජනා කරයි. මෙය සම්පූර්ණයෙන්ම අනඓතිහාසික හා අවිද්‍යාත්මක වේ. ශ්‍රී ලංකාවේ තාරුණ්‍යය අවිනිශ්චිත වන්නේ ඔවුන් ස්වභාවයෙන්ම නරුම හෝ සදාචාරාත්මක බංකොලොත් වීම නිසා නොවේ. රැකියා විරහිත බව, අඩු වැටුප්, අවිනිශ්චිත වාසස්ථාන, සූරාකෑමට ලක්වීම ආදිය හරහා ඔවුන්ගේ ජීවිත අවිනිශ්චිත බැවිනි ඔවුන් අවිනිශ්චිත වන්නේ. ශ්‍රම වෙලඳපොල ඔවුනට කිසිදු ආරක්ෂණයක් ලබා නොදේ. දේශපාලන පක්ෂවලින් කිසිදු අපේක්ෂා ඉටුවීමක් නැත. වෘත්තීය සමිති ඔවුන්ව පාවා දී තිබේ. ඔවුන්ගේ ඊනියා තීරනයක් නොමැතිබව අසාර්ථක වීමක් නොවේ; එය පුලුල් සමාජ අර්බුදයක ලක්ෂණයකි.

ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලාංකීය තරුණයින් මූලික වශයෙන් සදාචාරාත්මකව පිරිහී ඇත යන අදහස සිදුවීම් මගින්ම ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2022 දී, දරාගත නොහැකි ජීවන වියදම, ඉන්ධන හිඟය, අත්තනෝමතික මර්දනය සහ පාලක දේශපාලන සංස්ථාපිතයේ දූෂණයට විරෝධය පාමින් පෙර නොවූ විරූ ජනතා නැගිටීමකින් දස දහස් ගණන් තරුනයෝ වීදි බැස සිටියහ. මෙම ව්‍යාපාරය නාස්තිකවාදයේ ගිලී ගිය පරම්පරාවකින් හදිසියේම පැන නැගුනේ නොව, දශක ගනනාවක නව ලිබරල් ප්‍රතිපත්තියේ සහ අධිරාජ්‍යවාදී යටත්කිරීමේ ප්‍රතිවිපාකවලට ප්‍රතිරෝධය දැක්වීමට හා ඒවාට මුහුණ දීමට බලකෙරුණු ජනගහණයකින් පැනනැගුනකි.

චිත්‍රපටය සිදු කරන පරිදි, කොල්ලකාරී ආර්ථිකයක පසුබිමේ, ඔවුන්ගේ සහජ දෝෂ සහිත බව නිසා තාරුණ්‍යයට දිශානතියක් නොමැති බවට ප්‍රකාශ කිරීම ප්‍රතිගාමී දෘෂ්ටිවාදී ව්‍යාපෘතියකට

සහභාගී වීමකි. දේවප්‍රිය තාරුණ්‍යයට අනාගතයක් හෝ අතීතයක් ලබා නොදේ. ඔවුන් හුදෙක් දිරාපත්වීමේ, නරුමත්වයේ සහ දුසිරිතේ පාවෙන සංකේතකයන් වේ. ඔවුහු ප්‍රතිරෝධය, අරගලය, සාමූහිකත්වය හෝ දේශපාලන පිබිදීම පිළිබඳ කිසිදු හැඟීමකින් බල ගැන්වෙන්නේ නැත. කර්මාන්තයේ සහ විරෝධතාවේ කේන්ද්‍රස්ථානය වන කොළඹ නගරයේදී පවා සසිතට කිසිවිටෙක වැඩ වර්ජනයක්, ජන රැලියක් හෝ සාමූහික ප්‍රතිරෝධයක් ගැන ඉඟි කරන සංවාදයක් වත් හමු නොවේ. සවිඥානික පන්ති යුද පියවරයන්, එනම්, කප්පාදුව, පුද්ගලීකරනය, ණය අර්බුද හෝ සිවිල් යුද්ධය අවසන් වීමෙන් පසු මහජන ජීවිතය මිලිටරිකරණය කිරීම ආදී රටේ එදිනෙදා ජීවිතයේ නොවැළැක්විය හැකි යථාර්ථයන්, පිළිබඳව ඉඟි කිරීමක් වත් නැත. කම්කරු පන්තිය–එහි අතිමහත් පැවැත්ම සහ ඓතිහාසික වැදගත්කම තිබියදීත්–කොතැනකවත් සොයාගත නොහැක. ඒ වෙනුවට, සෑම කෙනෙකුම වින්දිතයෙකු හෝ වංචාකාරයෙකු වන නාගරික මහල් නිවාස සහ ගණුදෙණුමය සබඳතාවලින් සමන්විත වායුරෝධකව සංවෘත වූ ලෝකයක් අපට පෙන්වනු ලැබේ.

සසිත, ආගමික දේශනා, ජ්‍යෝතිශාස්ත්‍ර සහ රියැලිටි ශෝ–තරුණයන් හැඩගස්වා ගැනීමට අදහස් කරනා සේ දක්වන වැඩසටහන්–විකාශනය කරන රූපවාහිනී නාලිකා හරහා යන නමුත් කිසි විටෙකත් ප්‍රවෘත්ති, දේශපාලනය හෝ විරෝධතා රැගත් ඒවා ඒ අතර නොවේ. සතුරා දුරස්ථ ය, අරගලය නිෂ්ඵල ය. මෙය අහම්බයක් නොවේ, ඒ වෙනුවට එය, චිත්‍රපට අධ්‍යක්ෂකගේ පන්ති ඉදිරිදර්ශනය හෙළිදරව් කරන, නිතාමතා සිදුකළ තේරීමක් වේ.

පන්ති අරගලය යනු පන්ති ප්‍රතිරෝධය සහ සහෝදරත්වය යන දෙකෙහිම ඉහලම ප්‍රකාශනයයි – එය සිල්ලර කමට, ආත්මාර්ථකාමීත්වයට හෝ සදාචාර නරුමත්වයට ඉඩක් නොතබයි. එය සාමූහික අරගලය තුලින් ගොඩනැගුනු සමාජ වගකීම, විනය සහ සහකම්පනය පිළිබඳ ගැඹුරු හැඟීමක් කම්කරු පන්තියේ තරුණයින්ට ලබා දෙයි. අරමුනක් නැති, ආත්මාර්ථකාමී සහ අවිශ්වාසදායක ලෙස පින්තාරු කෙරෙන තාරුණ්‍යයේ මධ්‍යම පන්තික විප්‍රරූපණය රැක ගැනීමට නම්, පන්ති අරගලය ඔවුනට මුණ නොගැස්වීම අත්‍යවශ්‍ය වේ. චිත්‍රපට නිර්මාපකයා නිශ්චිතවම තෝරාගෙන ඇති මාවත මෙයයි: සමාජ සත්‍යය ආලෝකවත් කරනවාට වඩා චිත්‍රපටය සහතික කරන්නේ, එහි ප්‍රධාන චරිතය, සාමූහික ප්‍රතිරෝධය සමඟ වන කිසිදු මුණගැසීමක් මග හැරීමෙන්, ධනේශ්වර අගතීන් වලංගු කරන රාමුවක් තුළ සිරවී සිටීම යි.

මෑත දශක කිහිපය තුළ ජාත්‍යන්තරව මතු වූ පශ්චාත්-නූතන සිනමාව සමඟ බහුවිතවාදියා විශාල වපසරියක් බෙදා ගනී – මෙවැනි සිනමා පට, සමාජයේ කුනු කම සහ සදාචාරාත්මක පිරිහීම නිරූපණය කරමින් සමාජය විවේචනය කිරීමට අදහස් කරන බැව් පෙන්වා සිටින මුත් යථාර්ථයේ දී ඒවා එසේ වන්නේ මන්දැයි යන්න පිළිබඳ අවබෝධයක් හා, නිසැකවම, ඉදිරි මාවතක් ලබා නොදේ. මේවා ජීවිතය එහි පූර්ණත්වය සහ චලනය තුළ සංජානනය කරන කලා කෘති නොවේ – ඒවා, ඊට විපරීතව, හේතුකාරක [ඉතිහාසය හා පන්ති සබදතා තුල] සහ නියෝජකත්වය [පන්ති අරගලයේ] විභාග කිරීම ඉවත් කරන ලද නෂ්ටාපේක්ෂාවේ නිසල ඡායාරූ වේ.

යමෙකුට මෙය, ප්‍රධාන චරිතය (විජේ) කම්කරු පන්තිය සමඟ හමුවීමෙන් හැඩගැසෙන ධර්මසේන පතිරාජගේ අහස් ගව්ව (1974) වැනි චිත්‍රපටයක් හා සැසදිය හැක. එහිදී එම චිත්‍රපටය අවසන් වන්නේ අත්හැර දැමීමෙන් නොව, විඥානයේ පරිවර්තනයක් යෝජනා කරමින් එහි ප්‍රධාන චරිතය වෘත්තීය සමිති අරගලයකට සම්බන්ධ වෙමිනි. එසේත් නැතිනම්, විදේශයකට සංක්‍රමණය වීමට ඇති පෙලඹුම කේන්ද්‍ර කරගත් බූඩී කීර්තිසේනගේ මිල්ලේ සොයා (2004) සලකා බලන්න: එහි චරිත විලෝපිකයන් හෝ බියගුල්ලන් ලෙස නොව, කිසිවක් කරකියා ගත නොහැකි තත්වයකට ඇද දැමුණු හා ප්‍රතිඝතිකතාවන් දරාගත්, ඓතිහාසික පීඩනයන් මගින් හැඩගැසුණු පුද්ගලයන් ලෙස ඉදිරිපත් කෙරෙයි. මෙම කෘති තුළ, චරිත පරිණාමය වේ, අරගල කරති, එමෙන්ම ඔවුන් වටා ඇති සමාජ බලවේග සමඟ සම්බන්ධිත වේ. ඔවුන් ඉතිහාසය තුල ජීවමාන ය. ගැඹුරු අර්බුද වලින් ග්‍රහණය වී ඇති වර්තමාන සමාජය තුළ, පන්ති ප්‍රතිරෝධයේ උග්‍ර මට්ටමක් නොවැළැක්විය හැකි ලෙස පමනක් නොව වඩ වඩාත් පැහැදිලි ලෙසත් දිස්වේ.

සසිත–එසේම ඔහුගේ නේවාසික මිතුරා ද–රැකියාවක් සොයන බවක් නොපෙන්වයි: ඔහු රැකියා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් නොකරයි. ඔහු කිසිම දේශපාලන කතා බහක යෙදෙන්නේ නැත. ඔහුට ප්‍රවෘත්ති ගැන උනන්දුවක් නැත. ඔහු යුරෝපයට සංක්‍රමණය වීම ගැන කතා කරන නමුත් ඒ සඳහා අර්ථවත් පියවරක් නොගනී. චිත්‍රපටිය ආරම්භ වූ ආකාරයටම එකතැන පල්වෙමින් අවසන් වේ. මෙය අක්‍රියත්වයට පත්වීම පිළිබඳ කලාත්මක ගවේෂණයක් නොව යථාර්ථය සමඟ සම්බන්ධ වීම ප්‍රතික්ෂේප කිරීමකි. අද ලංකාවේ සැබෑ තරුණ තරුණියන් නිකම්ම නාස්තිකවාදී ගොහොරුවේ ලැග නොසිටිති. ඔවුන් රැකියා සොයමින්, සබඳතා ගොඩනගා ගනිමින්, විරෝධතාවලට සම්බන්ධ වෙමින්, කඩා වැටෙන ලෝකයක ඔවුන්ගේ ස්ථානය තේරුම් ගැනීමට උත්සාහ කරති. දේවප්‍රියගේ සසිත මේ පරම්පරාවේ

නියෝජනයක් නොවේ. ඔහු එයට එරෙහි අපවාදයකි.

*Ena Sendijarević* විසින් රචනා කොට අධ්‍යක්ෂණය කරන ලද *Take Me Somewhere Nice*(2019) චිත්‍රපටයේ රැකියා විරහිත තරුණයින්ගේ නිරූපණය ගැන අදහස් දක්වමින් ඩේවිඩ් වෝල්ෂ් මෙසේ නිරීක්ෂණය කරයි: "සිනමාකරු, ගෝලීය තරුණ පරම්පරාව තවමත් වික්ෂිප්තව නව දිශානතියක්, යම් ස්ථාවර, සුසංයෝගී, දේශපාලනික සහ සදාචාරාත්මක යොමු ලක්ෂයයක් සොයමින් සිටීමේ පරිමාව අවතක්සේරු කරයි. බොහෝ තරුණයින්, සරණාගතයින් වුවත් නැතත්, බෝල්කන් ප්‍රදේශයේ ජීවත් වනාවූ හෝ නැතත්, වර්තමානයේදී, පවතින සැකස්ම ගැන පිළිකුලෙන් පසුවන අතර තවමත් විකල්පයක් සොයාගෙන නොමැතිව, 'අතරමැදි' තත්වයක පසුවේ. මෙම 'අතරමැදි' තත්වය වත්මන් මොහොතේ 'මහා සිද්ධියට-පෙර' ගුණාංගය සමඟ බැඳී ඇත."

වොල්ෂ්ගේ අදහස දේවප්‍රියට සහ චිත්‍රපටයේ ඔහුගේ ප්‍රවේශයට එකසේ අදාළ වේ. බහුචිතවාදියා තාරුණ්‍යයේ අවිනිශ්චිත බව ග්‍රහණය කර ගන්නා නමුත් එම අවිනිශ්චිතතාවයේ සංක්‍රාන්තිමය, සොයා යෑමේ ස්වභාවය–එනම්, තරුණ ජනයා පවතින පිළිවෙල ප්‍රශ්න කරමින් විකල්ප සෙවීමට පටන් ගන්නා පුලුල් ඓතිහාසික මොහොත හා අවිනිශ්චිතතාව සම්බන්ධ කරන පුරුක–ග්‍රහණය කර ගැනීමට අපොහොසත් වේ.

එපමණක් නොව, චිත්‍රපටය එය ඉස්මතු කෙරුණු සුළු ධනේශ්වර ස්ථරය සඳහා දෘෂ්ඨිවාදීමය පෝෂණයකි. එය, දුප්පතුන් සහ රැකියා විරහිතයන් තමන්ගේම ඉරණමට වගකිව යුතු බවත්, ඔවුන් කම්මැලි, අවිශ්වාසී, දූෂිත සහ අධි- ලිංගිකත්වයට හුරු වූවන් බවට වන ඔවුන්ගේ පරාජකවාදි මතය ස්ථිර කරයි. එය කම්කරු පන්තිය පින්තාරු කරන්නේ සමාජ පරිවර්තනයේ නියෝජිතයා ලෙස නොව සදාචාර පරිහානියේ අසූචි වළක් ලෙස ය. යෞවනයන් සානුකම්පිතව නිරූපණය නොකෙරේ. මේ ආකාරයෙන්, පවතින තත්ත්වයට අභියෝග කිරීමට අර්මුණක් නැති අයගේ දෘෂ්ටිවාදී අවශ්‍යතා සඳහා චිත්‍රපටය සේවය කරයි. මෙය, ප්‍රතිරෝධය සඳහා උත්ප්‍රාසය(irony) ද පන්ති විශ්ලේෂණය සඳහා ව්‍යාධි විද්‍යාව(pathology) ද ආදේශ කරන ලෝක දැක්මක් සහිත පශ්චාත්-නූතන අශුභවාදයේ ප්‍රමුද්‍රාවයි.

දේවප්‍රියට දක්ෂතා නැතුවා නොවේ යැයි හැඟවෙන අවස්ථා චිත්‍රපටයේ ඇත. ඔහුගේ "ගුවන්විදුලි කතා" ගණනාවක් ඔහු බලාපොරොත්තු තැබිය හැකි කලාකරුවෙකු බව සනාථ කරයි. ඔහුට දෘශ්‍ය සංයෝජනය සඳහා හැඟීමක්, භාෂාව කෙරෙහි සංවේදීතාවක් සහ ආවෘතිභීතික (claustrophobic) නාගරික ජීවිතය නිරූපණය කිරීමට විචක්ෂණ හැකියාවක් ඇත. එහෙත්, වත්මන් අවධියේදී, මෙම කුසලතා, කම්කරු පන්තික තරුණයන් මුහුන දෙන සමස්ථ සමාජ හා ඓතිහාසික ගතිකත්වය ග්‍රහණය කර ගැනීමට අපොහොසත් වූ ලෝක දැක්මක් වන, අලාමුලාවූ මධ්‍යම පන්තික ස්ථරයක පටු නිම්වළින් හැඩගැසුණු ලෝක දැක්මකින් සීමා වී ඇත.

කලා කෘතියක් ශුභවාදී විය යුතු නැත, නමුත් එය සත්‍යවාදී විය යුතුය. එය මිනිස් හැසිරීම් හැඩගස්වන යටි තලයේ පවතින බලවේග හෙළි කිරීමට උත්සාහ කළ යුතුය. කලාකරුවෙකු ජීවිතය සංජානනය කිරීම පමණක් නොව, අනාගතයේ වහන්තරාව අර්ධ වශයෙන් ඉවත් කිරීමට උත්සාහ කළ යුතුය. ඔහු අද යථාර්ථය ගැන සෑහීමකට පත් නොවන විට, ඔහු එය පරමාදර්ශී "හෙට දින" ප්‍රිස්මය හරහා දැක "මිනිසා ඔහුගේ පරමාදර්ශීය විලාශයෙන් පෙන්විය යුතුය".


ඒ.කේ. වොරොන්ස්කි ලිවූ ලෙස,

"මිනිසා ඔහුගේ සම්පූර්ණ උත්තම තත්වය කරා යෑමේ සිහිනය, අභිලාෂය (yearning) සහ මනදොළ (Longing) හොඳම කලාකරුවන්ගේ නිර්මාණාත්මක කාර්යයේ පදනම සේ පවතින අතර, එසේ තිබීද ඇත" (කලාව ජීවිතය සංජානනය කිරීම ලෙස හා සමකාලීන ලෝකය, 1923)

මේ අර්ථයෙන් කලාව ඓතිහාසික සංජානනයේ මාධ්‍යයක් බවට පත්වේ. බහුචිතවාදියා මෙම කාර්යයේදී අසමත් වේ. එය අපේ කාලයේ සැබෑ අරගලවලින් විතැන් වෙමින් මිනිස් අසාර්ථකත්වයේ සීතල, පිළිකුල් සහගත චිත්‍රයකට පසුබසින චිත්‍රපටයකි.

අවසාන විග්‍රහයේ දී, බහුචිතවාදියා යනු තාරුණ්‍යය පිළිබඳව නොව, තාරුණ්‍යය අවබෝධ කර ගැනීමට යම් සමාජ ස්ථරයකට ඇති නොහැකියාව–ඔවුන් තුළින් සමාජයේ දිරාපත්වීමේ කැඩපතක් පමණක් නොව, එය අලුත් කිරීමේ විභවය දැකීමට අසමත්වීම–පිලිබද චිත්‍රපටයක් වේ. මේ චිත්‍රපටයේ ඛේදවාචකය එයයි.




මෙම පොත් මරිං බුක්ස් හරහා ඇනවුම් කරන්න.

Mehring Books

# the Socialist - හැඳින්වීමක්

the Socialist ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප-ශ්‍රී ලංකා) විප්ලවවාදී වාම ෆැක්ෂනය (කණ්ඩායම) වන **ශ්‍රී ලංකාවේ සහ දකුනු ආසියාවේ සමාජවාදී නායකත්වය**(එස්එල්එල්ඒ) හි ඩිජිටල් මාසික සඟරාවයි. එස්එල්එල්ඒ සමාජවාදී ජාත්‍යන්තරවාදය සඳහා සටන් කරන ට්‍රොට්ස්කිවාදී දේශපාලන ව්‍යාපාරයකි.

එය පිහිටුවන ලද්දේ, සසප-ශ්‍රී ලංකා හි නිලධාරිවාදී නායකත්වයට එරෙහිව එය තුල එක්ව සටන් කළ සහ පසුව, 2022 අප්‍රේල් - අගෝස්තු ශ්‍රී ලංකාවේ ඓතිහාසික මහජන අරගල අතරතුර හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (හජාජාක) ජාත්‍යන්තර සමාජවාදී ඉදිරිදර්ශනය සඳහා සටන් කිරීම නිසා, 2022 අග සිට 2023 මුල අතරතුර සසප නායකත්වය විසින් මූලධර්ම විරෝධී ලෙස නෙරපා හරින ලද සහෝදරවරු කණ්ඩායමක් අතරින්, විප්ලවවාදී ඉදිරි දර්ශනය මගින් පෙරී ආ සහෝදරවරුන් කිහිප දෙනෙකු විසිනි. පක්ෂයෙන් නෙරපා හරින ලද මෙම කන්ඩායම සසපයේ වාම කන්ඩායම ලෙස තමන්ව හඳුන්වා ගත් අතර පන්ති අරගලයට අදාළව පක්ෂයේ දේශපාලන පරිහානියට එරෙහිව සහ පක්ෂ නායකත්වයේ හඳුනාගත් ප්‍රතිගාමී දේශපාලන ප්‍රවනතාවන්ට එරෙහිව සටන් කිරීම ආරම්භ කළේය. සිද්ධීන් හා ගතවූ මාසවලදී, මෙම කන්ඩායම තුළ මතුවූ මුලුමනින්ම ප්‍රතිගාමී ජාතිකවාදී කල්ලියක් ෆැක්ෂන අරගලය ප්‍රතික්ෂේප කළ අතර, ඊට එරෙහිව සහෝදරවරු කිහිප දෙනෙක් බොල්ෂෙවික් ෆැක්ෂන අරගල විධික්‍රමයට සහ ජාත්‍යන්තර කමිටුවේ සමාජවාදී ජාත්‍යන්තරවාදය සඳහා සටන් කළහ. වසර භාගයකට වැඩි කාලයක් මෙම ප්‍රතිගාමී කල්ලිය සමග ප්‍රතිපත්තිමය දේශපාලන සටනකින් පසුව, සසප ගොඩ නැගීම සහ ශ්‍රී ලංකාවේ සහ දකුනු ආසියාවේ කම්කරු පංතියේ නායකත්වයේ ඓතිහාසික අර්බුදය විසඳීම අරමුනු කරගනිමින්, සසප තුල තත්කාලීනවාදී ජාතික අවස්ථාවාදයට එරෙහිව ෆැක්ෂන අරගලය ඉදිරියට ගැනීම සඳහා, එම සහෝදරවරු කිහිප දෙනා, මුලින් කී කල්ලියෙන් වෙන් වූ අතර, සසප-ශ්‍රී ලංකා හි ෆැක්ෂනයක් එස්එල්එල්ඒ නමින් පිහිටුවා ලූහ.

එස්එල්එල්ඒ අරමුණු කරන්නේ ධනවාදය ප්‍රතිසංස්කරණය කිරීමට නොව, ශ්‍රී ලංකා-ඊලම් එක්සත් සමාජවාදී සමුහාන්ඩුවක් එහි කොටසක් වූ ආසියාවේ සහ ලෝකයේ සමාජවාදී කම්කරු සමුහාන්ඩු සංගමයක් පිහිටුවීම සහ ලෝක ආර්ථිකයේ විප්ලවීය පරිවර්තනය හරහා සමාජවාදී, ප්‍රජාතන්ත්‍රවාදී සහ සමානාත්මතා සමාජයක් නිර්මාණය කිරීම යි. සමාජවාදය සඳහා – එනම් සමානාත්මතාවය සහ පෘථිවියේ ධනය තාර්කික හා ප්‍රජාතන්ත්‍රවාදී භාවිතය සඳහා – පොදු අරගලය තුල ශ්‍රී ලංකාවේ, දකුනු ආසියාවේ සහ ජාත්‍යන්තරව කම්කරුවන් එක්සත් කිරීමට අපි වෙර දරමු.

ලෝක සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය වන ජාත්‍යන්තර කමිටුවේ ඉදිරිදර්ශන හා වැඩපිළිවෙල මගින් මෙහෙයවනු ලැබෙන අපි එහි දේශපාලන අධිකාරිය පිළිගනිමු. සසප-ශ්‍රී ලංකා හි වත්මන් අවස්ථාවාදී නායකත්වයේ කට්ටිවාදී, තත්කාර්යවාදී, සංස්ථිතිකවාදී, නිලධාරිවාදී සහ විෂ සහිත ආත්මීයවාදී ප්‍රතිගාමී ප්‍රවනතාවයන්ට සහ ව්‍යාපාරය තුල ඇති සියලු ආකාරයේ ජාතිකවාදී ප්‍රවනතාවන්ට එරෙහිව, ජාත්‍යන්තර කමිටුවේ උරුමයේ ඓතිහාසික අඛන්ඩතාවය ආරක්ෂා කරමින්, ශ්‍රී ලංකාවේ සහ දකුනු ආසියාවේ කම්කරු පන්තිය ඉදිරියේ ඇති අරගල එක්සත් කර මෙහෙයවීම සඳහා අපි සටන් වදිමු. ජාත්‍යන්තර කමිටුව එරෙහිව සටන් වැදුනු, 1964 ලංකා සමසමාජ පක්ෂයේ මහා පාවාදීමෙන් වසර 60 කට පසුව ද තම නායකත්වයේ අර්බුදය විසඳීමට මෙම කලාපයේ කම්කරු පන්තියට තවමත් නොහැකි වී ඇති අතර, ගතවූ අඩ සිය වසකට වැඩි කාලයක් තුල ලංකාවේ සසප එය ගොඩ නැඟීමට අසමත් වී ඇත.

ජාත්‍යන්තර කමිටුව සහ එහි ලෝක ප්‍රකාශනය වන ලෝක සමාජවාදී වෙබ් අඩවිය (WSWS.org) විසින් පැහැදිලි කර ඇති පරිදි, හතරවන ජාත්‍යන්තරයේ පස්වන අදියර සමග සම්පාත වන ලෝක යුද්ධයේ හා සමාජවාදී විප්ලවයේ යුගයකට ලෝකය අවතීර්ණ වී ඇති අතර, අධිරාජ්‍යවාදී යුද්ධයේ ධනේශ්වර දේශපාලනයට එරෙහිව ලෝක සමාජවාදී විප්ලවයේ පන්ති පදනම් මූලෝපාය පිහිටුවීම සඳහා අවශ්‍ය සවිඥානික දේශපාලන නායකත්වය ලෙස ජාත්‍යන්තර කමිටුව ගොඩනැඟීම අවශ්‍ය වේ.

කම්කරුවන්ට, තරුනයින්ට, ශිෂ්‍යයින්ට, බුද්ධිමතුන්ට සහ ගෝලීය ධනේශ්වර අධිරාජ්‍යවාදී යුද පද්ධතිය, ෆැසිස්ට්වාදය, කප්පාදුව, සමාජ අසමානතාවය සහ ජාතික පීඩනය මුලිනුපුටා දැමීමට අවශ්‍ය සියල්ලන්ට අපි ආරාධනා කරන්නේ අද දින එස්එල්එල්ඒ හා සම්බන්ධ වෙමින්, මහජන අරගල විප්ලවවාදී ජයග්‍රහණ කරා ගෙන යාමේ හැකියාව පවතින එකම දේශපාලන ව්‍යාපාරය වන ලංකාවේ සසප තුල ඊට අවශ්‍ය කම්කරු පන්තියේ විප්ලවවාදී නායකත්වය ගොඩනැගීමේ අරගලය ඉදිරියට ගෙන යන ලෙස යි. සම්බන්ධ වන්න: socialistlead@gmail.com.